ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

පටුන

		පිටු අංක.
1.0	ප්‍රධාන සාරාංශය	1
	1.1 හැඳින්වීම	1
	1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු.....	1
	1.3 ප්‍රධාන කාර්යයන්	2
	1.4 සංවිධාන ව්‍යුහය	3
	1.5 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ හා සේවක සංඛ්‍යාව	4
	1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්	4
2.0	ප්‍රගතිය හා අනාගත දැක්ම	5
	• කර්මාන්ත සේවා අංශය	5
	• සංවර්ධන අංශය	10
	• විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය	16
	- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු ඒකකය	19
	- ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නාඩත්තු පුහුණු ඒකකය.....	20
	• කර්මාන්ත පුහුණු අංශය	27
	• නිවාස සැලසුම් හා ගොඩනැගිලි සඳහා මධ්‍යස්ථානය	29
	• මානව සම්පත් හා පරිපාලන අංශය	33
3.0	2019 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය.....	39
4.0	කාර්ය සාධන දර්ශක	72
5.0	මානව සම්පත් පැනිකඩ	74
6.0	අනුකූලතා වාර්තාව	76

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

1.0 ප්‍රධාන සාරාංශය

1.1 හැඳින්වීම

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ඉදිකිරීම් පුහුණු හා සංවර්ධනය සඳහා ආයතනයේ (ICTAD) අනුප්‍රාප්තිකයා ලෙස ස්ථාපිත කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"ගෝලීය ප්‍රමිතීන් හා සමාන්තර දිවෙන විශ්වාසනීය හා යෝග්‍ය වූ ඉදිකිරීම් කර්මාන්තයන් ශ්‍රී ලංකාවේ බිහිකිරීම"

මෙහෙවර

"ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතා වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ගෝලීය සහ දේශීය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම ඍත්තීය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලී නායකත්වයක් ලබාදීම"

අරමුණු

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දීර්ඝ වූ නිල නාමය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සමස්ථ අරමුණු සහ ඉලක්කයක් පහත පරිදි පිළිබිඹු කරමි.

"ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහාද, ඉදිකිරීම් සම්බන්ධව ජාතික උපදේශන සභාව පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහාද, කර්මාන්තයට අදාළ ඍත්තිකයන්, නිෂ්පාදකයන් ,සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුබසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතු වලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සඳහාද, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි."

1.3 ප්‍රධාන කාර්යයන්

- ගරු අමාත්‍යතුමාගේ මහ පෙන්වීම හා සමගාමීව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික වීම.
- ඉදිකිරීම් අංශය තුළ තිරසාර වර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම තිව්‍ර කිරීම අරමුණු කර මෙම කර්මාන්තයේ නිරතව සිටින පාර්ශවකරුවන්ට අවශ්‍ය නායකත්වය ලබාදීම.
- වරින් වර නියම කරනු ලබන ආකාරයට ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- බලශක්තිය කාර්යක්ෂමව පරිභෝජනය කළ හැකි වන ආකාරයට ගොඩනැගිලි සහ ආකෘති සැලසුම් කිරීම සඳහා විශේෂ අවධානයන් යොමු කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට සහ එහි වර්ධනයට අදාළ වන්නා වූ ඕනෑම කරුණක් පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම සහ නිසි පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම.
- අනෙකුත් අදාළ බලධාරීන්ගේ උපදෙස් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් විධිමත්ව සකස් කිරීම සහ ඒවා අනිවාර්යය සහ ඉච්ඡානුගත ප්‍රමිතීන් වශයෙන් වර්ග කිරීම.
- බලධාරියා විසින් විධිමත්ව සකසා ඇති පරිදි පරිචයන්, ක්‍රියාපටිපාටීන් හා ක්‍රියාවලීන් සහ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ ප්‍රලේඛනයන් ක්‍රියාවට නැංවීම.

පනතේ දක්වා ඇති සියලුම කාර්යයන් ආවරණය කරමින් අදාළ කාල රාමුව තුළ ඒවා ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගනිමින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඇත. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය , ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත හා 2015 – 2019 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුගමනය කරමින් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.

2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් කාල ඉලක්කයන් සමඟ හා එක් එක් ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත ආදායම සහ ලබාගත් ප්‍රගතිය අදාළ අංශ යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

1.4 සංවිධාන ව්‍යුහය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා)



1.5 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ

පහත සඳහන් පරිදි මෙහෙයුම් අංශ 04 ක් මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සිය කාර්යයන් ඉටු කරන අතර සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයා විසින් මෙහෙයවනු ලැබේ.

අ. කර්මාන්ත සේවා අංශය

ආ. සංවර්ධන අංශය

ඇ. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

ඈ. කාර්මික පුහුණු අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

I. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදලේ අරමුදල - අභ්‍යන්තර අරමුදල

II. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල - ස්ථාපිත කිරීම සඳහා

2.0 ප්‍රගතිය හා අනාගත දැක්ම

කර්මාන්ත සේවා අංශය

ඉදිකිරීම් කර්මාන්තය නියාමනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමත් සමඟ කර්මාන්ත සේවා අංශය විධිමත්ව සකස් කර ඇති අතර එමඟින්, ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ ප්‍රමිති, පිරිවිතර හා මාර්ගෝපදේශ, උපදෙස් සකස් කිරීම, අවශ්‍ය පරිදි විනිශ්චයකරුවන් පත් කිරීම, සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම, තත්ත්ව කළමණාකරණ විගණකවරුන්, විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීම හා ඉදිකිරීම් වැඩ හඳුනාගැනීම, තාක්ෂණික විගණනය, සමථකරණයන් සිදු කිරීම, පාර්ශවකරුවන්ගේ ධාරිතා ගොඩනැඟීම, උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම සහ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වෙනත් කාර්යයන් සිදු කරනු ලැබේ.

කර්මාන්ත සේවා අංශය විසින් කර්මාන්තයේ පාර්ශවකරුවන්ට (එනම් උපදේශකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ආයෝජකයින් ආදී) 2019 වර්ෂය තුළදී පහත සඳහන් ක්ෂේත්‍රයන්හි එහි සේවා සපයයි.

- උපදේශන සේවා සැපයීම, ආරවුල් විසඳීමේ සැසිවාර හා සමථකරණයන් සිදු කිරීම සහ ගිවිසුම්ගත කරුණු පිළිබඳ විනිශ්චයකරුවන් පත් කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම.
- ඉදිකිරීම් සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රමිති, මාර්ගෝපදේශ හා පිරිවිතරයන් ප්‍රසිද්ධ කිරීම.
- සම්මත ලංසු ලියකියවිලි ප්‍රසිද්ධ කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට අදාළ මාතෘකා පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම.
- දිස්ත්‍රික් මට්ටමේ කාර්යාල ස්ථාපිත කිරීම.
- තාක්ෂණික විගණනය සඳහා පරිපාටි ස්ථාපිත කිරීම හා සුදුසු කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම සඳහා පිළියෙල කිරීම.
- සුදුසුකම්ලත් තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා පරිපාටි ස්ථාපිත කිරීම.
- විනිශ්චය (කෙටුම්පත) සඳහා පරිපාටි ස්ථාපිත කිරීම.
- පරිසරය හා මහජන සෞඛ්‍ය (කෙටුම්පත) පිළිබඳ රීති හා රෙගුලාසි ස්ථාපිත කිරීම.
- සදාචාරාත්මක හා සමාජ ප්‍රමිතීන් (කෙටුම්පත) සඳහා රීති හා රෙගුලාසි ස්ථාපිත කිරීම.

❖ **උපදේශන සේවා සැපයීම, ආරවුල් විසඳීම, සමථකරණයන් හා ගිවිසුම්ගත කරුණු වෙනුවෙන් විනිශ්චයකරුවන් පත් කිරීම.**

මෙම අංශය මඟින් ලංසු ලියකියවිලි, කොන්ත්‍රාත් පරිපාලනය, ආරවුල් විසඳීම, මිල උච්චාවචනය මත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වර්ගීකරණය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සම්මත ලංසු ලේඛන, තාක්ෂණික ප්‍රමිතීන්, තාක්ෂණික පිරිවිතරයන් සහ මාර්ගෝපදේශ ආදිය සඳහා උපදෙස් ලබා දීම සිදු කරයි.

ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව ගිවිසුම්ගත ආරවුල් වලට මුහුණ දුන් කොන්ත්‍රාත්කරුවන් විශාල සංඛ්‍යාවක් මෙන්ම රාජ්‍ය ආයතනද මෙම අංශයෙන් වාචිකව හා ලිඛිතව උපදෙස් ඉල්ලා සිටින ලදී. 2019 වර්ෂය තුළදී ඉහත සඳහන් ගැටලුවලට අදාළව 2050 ක උපදේශන සේවා සංඛ්‍යාවක් ලබාදෙන ලදී.

ගිවිසුම්වලට අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම මත 2019 වර්ෂය තුළදී විනිශ්චයකරුවන් 22 ක සංඛ්‍යාවක් පත්කරන ලදී.

2019 වර්ෂය තුළදී පහත සඳහන් සමථකරණයන් සිදුකර ඇත.

- රිකෝටා හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - කොළඹ දකුණ ශික්ෂණ රෝහල කළුබෝවිල කොන්ත්‍රාත්කරුවන් සඳහා කාර්යාලය හා ගබඩා ඉදි කිරීම (කොන්ත්‍රාත්තුව අවසන් කිරීම) කොළඹ දකුණ ශික්ෂණ රෝහල කළුබෝවිල
- සිංහ රුවන් කන්ස්ට්‍රක්ෂන්ස් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගාල්ල බද්දේගම ප්‍රදේශීය සභාවේ මහල් 3 ක ගොඩනැගිල්ල ඉදි කිරීම.
- ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - වාසිරි කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් අසාධාරණ ලෙස කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳ පැමිණිල්ල
- ක්‍රිෂාණි කන්ස්ට්‍රක්ෂන්ස් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අක්මීමන නව ගොඩනැගිල්ල වටා පදිකය මත ගල් ඇතිරීම - අක්මීමන ප්‍රාදේශීය සභාව
- ධර්මදාස කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් - මධ්‍යම සංස්කෘතික අරමුදල පොලොන්නරුව පූජා නගරයේ ඉන්ටර්ලොග් පදික ඇතිරීම් කොන්ත්‍රාත්තුවේ ගැටලු
- මීගමුව නගර සභාව - සුමනසේකර කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මීගමුව නගර සභාවේ මහජන පුස්තකාලය සහ ආර්ථික පහසුකම් සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම
- වී.වී රාමනාදන් ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, උතුරු පළාත ගොඩනැගිල්ල පවරා ගැනීම සඳහා මැදිහත්වීමට ඉල්ලීම
- කේ.එස් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් - ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ් ,බත්තරමුල්ල වික්‍රමසිංහපුර ස්වාධීන රූපවාහිනී නෙට්වර්ක් ලිමිටඩ් හි චිත්‍රාගාර සංකීර්ණය සහ කාර්යාල පරිශ්‍රය සඳහා මහල් හතරක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වායුසමීකරණ හා වාතාශ්‍ර පද්ධතිය සැපයීම හා ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ආරම්භ කිරීම.
- විජය ඉංජිනියරින් - සීමා සහිත කිරිඇල්ල විවිධ සේවා සමුපකාර සමිතිය පිරවුම්හල ඉදිකිරීම (අදියර 01) සීමා සහිත කිරිඇල්ල විවිධ සේවා සමුපකාර සමිතිය
- මනම්පේරි ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් - ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ්
  සීමා සහිත ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් සඳහා යෝජිත මහල් 06ක කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම.
- ධර්මදාස කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් - සීමා සහිත එයාර්පෝට් ඇන්ඩ් එවි ඒසන් සර්විසස් (ශ්‍රී ලංකා) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම.

2016 වර්ෂයේ සිට විනිශ්චයකරුවන් ලැයිස්තුව සිඩා(CIDA) වෙබ් පිටුවේ පල කරන ලදී. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව, විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීම අවශ්‍ය වේ. 2019 වර්ෂයේදී ගැසට් පත්‍රය සකස් කර විනිශ්චයකරුවන් 29 දෙනෙකු අධිකාරියේ ලියාපදිංචි කරන ලදී.

❖ **ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම**

තාක්ෂණික කාර්යය මණ්ඩලයක් නොමැති රජයේ ආයතන නිතර ඔවුන්ගේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මෙම අංශයෙන් ව්‍යාපෘති කළමනාකරණ සේවා ඉල්ලා සිටී. අපි මෙම සේවාවන් රජයට ලබාදෙන අතරම ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ හැකියාවන්ද අපි ගොඩනගමු. මෙම සේවාවට ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ලංසු ලේඛන පිළියෙල කිරීම, කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකයින් තෝරා ගැනීම, ලංසු ඇගයීම, කොන්ත්‍රාත් පරිපාලනය හා ගෙවීම් සහතික සකස් කිරීම ආදිය පිළිබඳ උපදෙස් ඇතුළත් වේ.

2019 වර්ෂයේදී ව්‍යාපෘති කළමනාකරණ සේවා සපයා ඇති ප්‍රධාන ආයතන පහත දැක්වේ.

- පොල් සංවර්ධන අධිකාරිය - වෙන්දේසි ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය -හදිසි අවස්ථා සඳහා එකතු කිරීම් සහ වෙනස් කිරීම් - ගින්නකදී රසායනාගාර ගොඩනැගිල්ලෙන් පිටවීම

❖ **ඉදිකිරීම් සංඛ්‍යාලේඛන පිළිබඳ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මාසික ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම.**

දර්ශක සකස් කිරීම සඳහා ද්‍රව්‍යවල මිල, ශ්‍රම වැටුප් සහ පිරියත කුලී රේටයන් රැස්කර, පරීක්ෂාකර විශ්ලේෂණය කරන ලදී. මෙම ප්‍රකාශනය ඉදිකිරීම් ව්‍යාපෘතිවල මිල උච්චාවචනයන් ගණනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිතා කෙරේ. ප්‍රකාශනවල පිටපත් 1,584ක සංඛ්‍යාවක් ඉදිකිරීම් කර්මාන්තයේ යෙදී සිටින පාර්ශවකරුවන්ට වර්ෂය තුළ අලෙවි කරන ලදී.

ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා උපදෙස් දීම සඳහා පහත සඳහන් ආයතනවලින් සමන්විතව කමිටුවක් ස්ථාපනය කරන ලදී.

1. මාර්ග සංවර්ධන අධිකාරිය
2. ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය
3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉදිකිරීමකරුවන්
4. තරුණ ඉදිකිරීම්කරුවන්ගේ සංසදය
5. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
6. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව

❖ **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රමිති, පිරිවිතර හා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම.**

2019 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද ලේඛන වූයේ,

- CIDA/STD/03 – ඉදිකිරීම් හරිත මාර්ගෝපදේශය- ගොඩනැගිලි ව්‍යාපෘති ඉදිකිරීමේ අදියර සඳහා පාරිසරික මාර්ගෝපදේශයකි.
- CIDA/STD/04 - ඉදිකිරීම්වලදී සෞඛ්‍ය සහ ආරක්ෂාව
  ඉදිකිරීම්වලදී සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා ප්‍රමිති.

❖ **සම්මත ලංසු ලේඛන ප්‍රකාශයට පත් කිරීම**

පහත සඳහන් සම්මත ලංසු ලේඛන 3 සංශෝධනයට ලක්විය.

සම්මත ලංසු ලේඛන කුඩා හා මධ්‍යම ගිවිසුම්.

- සම්මත ලංසු ලේඛන ප්‍රධාන කොන්ත්‍රාත් කෙටුම්පත සහ සම්මත ලංසු ලේඛන 4 - සැලසුම් සහ ගොඩනැගීමේ කොන්ත්‍රාත් මහජන අදහස් සඳහා යවන ලදී.

ඉදිකිරීම් කර්මාන්තයට අදාළ මාතෘකා පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම.

කර්මාන්තයේ ධාරිතා වර්ධන අවශ්‍යතා හඳුනාගනිමින් මෙම අංශය පහත සඳහන් මාතෘකා යටතේ සම්මන්ත්‍රණ 5 ක් පවත්වන ලදී.

ප්‍රධාන කාර්යාලය -

- කොන්ත්‍රාත් කටයුතු සඳහා විවෘත්තා ධාරිතාවක් සකස් කිරීම
- ව්‍යුහාත්මක ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට්
- විනිශ්චය කිරීමේ අත්දැකීම්
- ඉදිකිරීම්වලදී මිල උච්චාවචනයන්
- ඉදිකිරීම්වලදී කොන්ත්‍රාත් පරිපාලනයේ කැපී පෙනෙන ලක්ෂණ

දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන්

I. සම්මත මිනුම් ක්‍රමය - 2019 ජනවාරි 19 හා 20 ගාල්ල, කොන්ත්‍රාත් කටයුතු සඳහා විවෘත්තා ධාරිතාවන් සකස් කිරීම, 2019 ජනවාරි 11 කොළඹ, ටෙන්ඩර් කිරීම හා ඇස්තමේන්තු කිරීම, 2019 ජනවාරි 26 හා 27 අනුරාධපුර, කොන්ත්‍රාත් පරිපාලනයේ වැදගත් ලේඛන - 2019 ජනවාරි 29 ගම්පහ.

II. ව්‍යුහාත්මක ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් - 2019 පෙබරවාරි 14 - කොළඹ, කොන්ත්‍රාත් පරිපාලනයේ වැදගත් ලේඛන - 2019 පෙබරවාරි 23 කුරුණෑගල, විනිශ්චය කිරීමේ අත්දැකීම් - 2019 පෙබරවාරි 07 - කොළඹ, ටෙන්ඩර් කිරීම හා ඇස්තමේන්තු කිරීම, 2019 පෙබරවාරි 14 සහ 15 - මඩකලපුව

III. කොන්ත්‍රාත් පරිපාලනය SBD 03 – 2019 මාර්තු 23 සහ 24 - යාපනය, ටෙන්ඩර් කිරීම හා ඇස්තමේන්තු කිරීම - 2019 මාර්තු 28 හා 29 - මඩකලපුව, ඉදිකිරීම් කාල කළමනාකරණය - 2019 මාර්තු 30 –කළුතර, ගොඩනැගිලි සේවා ඉංජිනේරු (MEP) – 2019 මාර්තු 30 සහ 31 - අම්පාර

IV. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ, සම්මත ලංසු ලේඛන මත පදනම්ව කාලය දිර්ඝ කිරීමේ හිමිකම් සහ ගෙවීම් පිළිබඳ ගැටලු - 2019 මැයි 25 - මාතර

V. මිල උච්චාවචනය සූත්‍රය - 2019 ජූනි 15 - මාතලේ, ලංසු ලේඛන පිළියෙල කිරීම හා ලංසු ඇගයීම - 2019 ජූනි 22 - කෑගල්ල, මිල උච්චාවචනය සූත්‍රය - කොළඹ

VI. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මත පදනම්ව කාලය දීර්ඝ කිරීමේ හිමිකම් හා ගෙවීම් පිළිබඳ ගැටලු - 2019 ජූලි 21 - අනුරාධපුරය

VII. සම්මත ලංසු ලේඛන හා ඉදිකිරීම්වලදී මුදල් ප්‍රවාහය කළමණාකරනය - 2018 අගෝස්තු 18 - කුරුණෑගල , 2018 සැප්තැම්බර් 15 - කලුතර

VIII. ඉදිකිරීම්වලදී කොන්ත්‍රාත් පරිපාලනයේ කැපී පෙනෙන ලක්ෂණ - 2019 අගෝස්තු 01 - කොළඹ, ඉදිකිරීම්වලදී ප්‍රසම්පාදනයේ කැපී පෙනෙන ලක්ෂණ - 2019 අගෝස්තු 27 - ත්‍රිකුණාමලය

IX. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්වල කළමනාකරණය අඩුකිරීම, ඉවත් කිරීම, ප්‍රමාදවීම, ආරවුල්, ගැටලු, හිමිකම්, දූෂණ වගන්ති, නීති විරෝධී වගන්ති, ප්‍රායෝගික නොවන පිරිවිතර - 2019 සැප්තැම්බර් 3 - ගාල්ල

X. හරිත ද්‍රව්‍ය - 2019 ඔක්තෝබර් 1 - කලුතර, විදුලි ස්ථාපනය සැලසුම් කිරීම - 2019 ඔක්තෝබර් 12 සහ 13 - අම්පාර, 2019 ඔක්තෝබර් 26 - මුලතිවු සහ පුත්තලම, 24 දින - ගම්පහ, මාතර

❖ තාක්ෂණික විගණනය

තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම සඳහා රීති හා රෙගුලාසි සහ තත්ත්ව කළමනාකරණ විගණකවරුන්ගේ ලේඛනයන් පවත්වාගෙන යාම සහ තාක්ෂණික විගණනය සිදුකිරීමේ ක්‍රියා පටිපාටිය ප්‍රකාශයට පත් කිරීම සිදුකර ඇත.

මෙම අංශය විසින් එක් තාක්ෂණික විගණනයක් සිදුකර ඇත.

- බලපිටිය ප්‍රාදේශිය සභාව

❖ සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම

සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා රීති හා රෙගුලාසි විමර්ශන ක්‍රියා පටිපාටිය සහ සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් භාවිතා කළ යුතු ලේඛන ප්‍රකාශයට පත්කරන ලද අතර ලියාපදිංචිය ක්‍රියාත්මක වෙමින් පවතී.

❖ විනිශ්චය කිරීමේ ක්‍රියාපටිපාටිය ස්ථාපිත කිරීම

ලියාපදිංචි විනිශ්චයකරුවකු සඳහා වන රීති හා රෙගුලාසි සහ විනිශ්චය කිරීමේ ක්‍රියාපටිපාටිය ගැසට් කර ඇත.

❖ විනිශ්චය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

විනිශ්චය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019 වර්ෂයේදී අවසන් කරන ලද අතර විනිශ්චයකරුවන් 15 දෙනෙකු විභාගය සමත් විය.

සංවර්ධන අංශය

1. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ යෝජනා ක්‍රමය

ලියාපදිංචි කිරීම සහ ශ්‍රේණිගත කිරීම යනු යම් නිශ්චිත කොන්ත්‍රාත්තුවක් සඳහා යොමු කිරීමකින් තොරව විවිධ වර්ගවල හා ප්‍රමාණයන්වල ව්‍යාපෘති සිදුකිරීමේ සාමාන්‍ය හැකියාව තීරණය කිරීම සඳහා අනාගත කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් සඳහා පරීක්ෂණ ක්‍රියාවලියකි. කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හා මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමෙන් ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම තීරණය වේ.

2019 වර්ෂය තුලදී, නව ලියාපදිංචි කිරීම් 991 ක් නිකුත් කරන ලද අතර, කොන්ත්‍රාත්කරුවන් 438 දෙනෙකු උසස් කරන ලදී. ලියාපදිංචි කිරීම් 798 ක සංඛ්‍යාවක් අලුත්කරන ලදී.
2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන අනුව, 2013 මාර්තු 28 දින අංක 2116/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පහත සඳහන් රෙගුලාසිය ප්‍රකාශයට පත් කරන ලදී.

<u>රෙගුලාසිය</u>

55 (2) වගන්තිය - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පිහිටුවන ලද තොරතුරු ලේකම් කාර්යාලයේ කාර්යයන්.

- වෙබ් පාදක ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ අධීක්ෂණ පද්ධතිය (CCPMS) සහ ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)

ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ අධීක්ෂණ පද්ධතිය (CCPMS)

මෙම මාර්ගගත අධීක්ෂණ පද්ධතිය මඟින් කොන්ත්‍රාත්කරුවන්, සේවාදායකයින් හා උපදේශකයින්ගේ ප්‍රධාන සහභාගීත්වයෙන් සිදු කරන ලදී. කෙසේ වෙතත් උපදේශකයින්ගේ ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් මෙම ක්‍රමය අඩු වේගයකින් ක්‍රියාත්මක විය.

ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)

ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය යනු ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සඳහා සංවර්ධනය කරන ලද වෙබ් ද්වාරයයි. කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය, ඉදිකිරීම් කර්මාන්ත රෙගුලාසි, ඕනෑම පුද්ගලයෙකුගේ භාවිතය සඳහා ඉදිකිරීම් ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික දත්ත එයට ඇතුළත්ය. තවද එය ජාත්‍යන්තර දත්තවලට ප්‍රවේශවීම සඳහා විශ්වාසදායක ප්‍රභවයක් ලෙස ක්‍රියාකරනු ඇත. කර්මාන්තයේ දායකවන සාධකවල උච්චාවචනයන්, රජයේ නීති සම්පාදනයන්, රීති හා රෙගුලාසි සහ කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය වැනි පවතින කරුණු අනුව එය නිතිපතා සංවර්ධනය කෙරේ.
2017 සහ 2018 වර්ෂ තුල ද්වාරයෙහි සංවර්ධන කටයුතු අවසන් කර ඇති අතර අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර ඉදිකිරීම් සංවර්ධන පනතට අනුව එයට නීතිමය සහාය ලබාදීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.
ශ්‍රී ලංකාවේ වඩාත් ඵලදායී හා ප්‍රතිඵලදායී කර්මාන්තයන් සඳහා පහසුකම් සපයන ලෝක ව්‍යාප්ත ඉදිකිරීම් ප්‍රජාවට ජාතික සේවාවන් ලෙස දත්ත එක්රැස් කිරීමේ යාන්ත්‍රණය ගැසට් කළ වහාම මෙම ද්වාරය වෙබ් ගත කිරීම සඳහා සැලසුම් කර ඇත.

2.0 ඉදිකිරීම් විශිෂ්ටත්වය වෙනුවෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) සම්මාන

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධන කිරීම සඳහා 1990 වර්ෂයේදී ආරම්භ කරන ලද වාර්ෂික සම්මාන යෝජනා ක්‍රමය අඛණ්ඩව 30 වන වරටත් 2019 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම සම්මාන යෝජනා ක්‍රමය, ඉදිකිරීම් කළමනාකරණයේ කැපී පෙනෙන කාර්ය සාධනය, තාක්ෂණික විශේෂඥතාව හා ගුණාත්මකභාවය පිළිබඳ ඉහළ වෘත්තීය මට්ටම, නව්‍ය හා සුදුසු තාක්ෂණය හඳුන්වාදීම සහ ශිල්පීන් පුහුණු කිරීම සඳහා සහභාගි වීම ආදිය හඳුනාගනී.

2019 වර්ෂය තුලදී, ස්ථානීය පරීක්ෂණ / කමිටු රැස්වීම් 29 ක් පවත්වන ලදී. ඉදිරිපත් කිරීම් වැඩසටහන් 4 ක් වසර අවසානයේදී පවත්වන ලද අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් සංවිධානය කරන ලද, ඉදිකිරීම් සම්මාන සඳහා වූ 2019 ජාතික සම්මාන උළෙලේදී සම්මාන පිරිනැමීමට නියමිත විය. මෙම වැඩසටහන තුළ කර්මාන්තයට ප්‍රවීණ දායකයින් විශාල පිළිගැනීමක් ලබාදී ඇති අතර එය පොදු සිදුවීමක් වේ.

සම්මානලාභීන් 2019

ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් විශිෂ්ටතා සම්මාන හා ඉදිකිරීම් කුසලතා සම්මාන

සම්මාන වර්ගය	ව්‍යාපෘතිය හා ලබන්නා	කොන්ත්‍රාත්කරු
විශිෂ්ටත්වය	හෝමාගම, දියගම,මොරටුව තාක්ෂණ විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ නැවත ස්ථානගත කිරීම හා සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය	අයිසිසි(ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	බස්නාහිර පළාත් සභාව සඳහා සභාගර්භය ඇතුළු යෝජිත බහු මහල් කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම - ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල	සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	ෆෙයාර්වේ එලිමන්ට්ස් සඳහා යෝජිත මහල් නිවාස සංකීර්ණය II - තලාහේන, මාලඹේ.	මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	යෝජිත මාලඹේ ඕකිඩ් මහල් නිවාස සංකීර්ණය II ඉදිකිරීම - තලාහේන, මාලඹේ.	අයිසිසි (ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	යෝජිත බහු මහල් මිශ්‍ර සංවර්ධනය	තුඩාවේ බ්‍රදර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	ඕෂන් ෆ්‍රන්ට් කොන්ඩෝස් ඉදිකිරීම -ත්‍රිකුණාමලය	අයිසිසි(ප්‍රයිවට්) ලිමිටඩ්
විශිෂ්ටත්වය	යෝජිත බංගලා ඉදිකිරීම - එස් ඒ අයි එෆ් එස්ටේට් බණ්ඩාරවෙල	අයිසිසි(ප්‍රයිවට්) ලිමිටඩ්

කුසලතා	නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය - හේනමුල්ල, කොළඹ 15	ඇක්සෙස් ඉංජිනියරින් පී. එල්. සී.
කුසලතා	ෆෙයාර්වේ හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා යෝජිත බහු මහල් නිවාස ගොඩනැගිලි සංකීර්ණය - ගාල්ල	මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
කුසලතා	එස් එම් අයි හවුසින් ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි යෝජිත සුඛෝපභෝගී නිවාස සංකීර්ණය, ඩීල් පෙදෙස, කොළඹ 03.	මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
කුසලතා	සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, කටුනායක	ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
කුසලතා	මලියදේව බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශය සඳහා යෝජිත තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල - කුරුණෑගල	ඒ එම් එස් කේ කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

අනු අංකය	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	පස්සර - මොණරාගල මාර්ගය කිලෝමීටර 0+000 සිට 27+000 දක්වා පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම. කොන්ත්‍රාත් අංක RDA/DW/UVA/LBFP/2011/130 තුඩාවේ බ්‍රදර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් විසින්	සම්මානය
02	මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 57 ක් පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම - කොන්ත්‍රාත් 02 එඩිවර්ඩ් සහ ක්‍රිස්ටි විසින්	සම්මානය
03	වියළි කලාපයේ නාගරික ජලය සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය - වවුනියාගි මතුපිට ජල සංවර්ධනය කේ.ඩී.ඒ. වීරසිංහ ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්	සම්මානය
04	එම් /එස් ඩෙවිඩ් පියරිස් රේසින් ඇන්ඩ් ලේෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා වලගම, බණ්ඩාරගම දැනට පවතින කාර්වින් ධාවන පථයට දිගුවක් ඉදිකිරීම, මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්	සම්මානය

ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා ජාතික සම්මානය 2019

(සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති I)

සම්මානලාභීන්

සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් කාර්ය සාධන සම්මාන (සම්පූර්ණ කිරීමෙන් පසු ඇගයීම් කළ)	
2019	වර්ගය I - වටිනාකම රු. මිලියන 1,000 ඉක්මවන පස්සර, මොණරාගල මාර්ගය 0+000 සිට 27+000 දක්වා පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම. කොන්ත්‍රාත් අංක RDA/DW/UVA/LBFP/2011/130 තුඩාවේ බ්‍රදර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 57 ක් පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම - කොන්ත්‍රාත් 02 එඩිවර්ඩ් සහ ක්‍රිස්ටි විසින් වියළි කලාපයේ නාගරික ජලය සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය - වවුනියාහි මතුපිට ජල සංවර්ධනය කේ.ඩී.ඒ. වීරසිංහ ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්
සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් කාර්ය සාධන සම්මාන (සම්පූර්ණ කිරීමෙන් පසු ඇගයීම් කළ)	
2019	වර්ගය II - වටිනාකම රු. මිලියන 500 හා රු. මිලියන 1,000 අතර එම් /එස් ඩේවිඩ් පියරිස් රේසින් ඇන්ඩ් ලේෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා වලගම, බණ්ඩාරගම දැනට පවතින කාට්ටන් ධාවන පථයට දිගුවක් ඉදිකිරීම, මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්
ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා සම්මාන (ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු) දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් විදේශීය ව්‍යාපෘති සඳහා සම්මාන	
2019	මාලදිවයිනේ නිවාඩු නිකේතන ඉදිකිරීමේ ව්‍යාපෘතිය මාලදිවයින් සන්කෙන් ඕවර්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා ජාතික සම්මානය - 2019

හරිත ව්‍යාපෘතිය - සම්මානලාභීන්

අංකය	ව්‍යාපෘතිය හා ලබන්නා	සම්මාන වර්ගය
01	ක්ලියර් පොයින්ට් රෙසිඩන්සිස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රාජගිරිය සඳහා යෝජිත ක්ලියර් පොයින්ට් රෙසිඩන්සිස්, මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්	විශිෂ්ටත්වය

3.0 පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලැබී ඇති පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, (NCASL) සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) සාමාජිකයින්ගෙන් සමන්විත මූලික විමර්ශන මණ්ඩලයක් පිහිටුවා ඇත.

2019 වර්ෂය තුලදී,

විස්තරය	ආරවුල් - 2019
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තොරතුරු සඳහා පමණක්	05
පැහැදිලි කිරීම කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලා සිටි අතර ඔවුන් ප්‍රතිචාර දැක්විය යුතුය.	53
විසඳා ඇත.	42
විමර්ශනය සඳහා ඉතිරිව ඇත.	11
එකතුව	111

4.0 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ජර්නලය - 2019

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2019- ජර්නලය ප්‍රකාශයට පත් කර 2020.02.25 දින පැවැත්වීමට නියමිත වූ ඉදිකිරීම් සඳහා ජාතික සම්මාන උළෙලේදී එළිදැක්වීමට නියමිතය. ඉදිකිරීම් කර්මාන්තයේ ගුණාත්මක කරුණු හා සම්බන්ධව තොරතුරු බෙදාහැරීම මෙහි අරමුණයි. ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ජර්නලය මඟින් ප්‍රයෝජනවත් ලිපි හා තොරතුරු සපයයි.

මෙය සඟරාවේ 18 වන කලාපය වන අතර, මේ වසරේදීද සිඩා/ ඉක්ටාඩ් ඉතිහාසයේ අඛණ්ඩව 11 වන වරටත් ජාත්‍යන්තර තීරක විනිසුරු ජර්නලයක් ලෙස පාර්ශවකරුවන්ගේ සහ වෘත්තිකයන්ගේ උපරිම සහයෝගය හා කැපවීම සහිතව ජර්නලය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

5.0 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තොරතුරු තාක්ෂණ පද්ධතිය

පහත සඳහන් නව වැදගත් ක්‍රියාකාරකම් වෙබ් අඩවියට එක් කිරීම සඳහා හඳුනාගෙන ඇති අතර 2019 අවසාන මාස කිහිපය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පැවතුණි.

1. දේපල සංවර්ධන ලියාපදිංචි කිරීමේ පද්ධතිය.
2. CCD Points වැඩසටහන් ගෙවීම් මොඩියුලය.
3. විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රම පද්ධතිය.
4. ඉදිකිරීම් ද්‍රව්‍ය සහ සංරචක ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය.
5. සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පද්ධතිය.
6. හඳුනාගත් ඉදිකිරීම් වැඩ තොරතුරු පද්ධතිය.
7. තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය.
8. ද්‍රව්‍යමය පිරිවැය ගණනය කිරීමේ පද්ධතිය.

10. ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ ලියාපදිංචි කිරීමේ පද්ධතිය.
11. ගෙවීම් ද්වාර ඒකාබද්ධ කිරීම.
12. වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම.
13. ලේඛන කළමනාකරණ පද්ධතිය.

6.0 2019 වර්ෂයේදී පවත්වන ලද සම්මේලන / සම්මන්ත්‍රණ හා වැඩමුළු

වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

1. අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ව්‍යාපෘතිය මඟින් නායයෑම් අවදානම අවම කිරීම් පිළිබඳ වැඩසටහන (RLVVMP) - ජනවාරි 18
2. තිරසාර ද්‍රව්‍ය හා ඉදිකිරීම් ශිල්පීය ක්‍රම - ජනවාරි 25
3. ගිනි පිළිබඳ රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම - පෙබරවාරි 13
4. ඉදිකිරීම් ස්ථානවල ආරක්ෂාව - මාර්තු 29
5. නේවාසික හා වාණිජ ගොඩනැගිලිවල LPG පද්ධති ස්ථාපනය කිරීම - ජූනි 27
6. විදුලිබල ආරක්ෂණ හා බලශක්ති කළමනාකරණ විකල්ප - ජූලි 25

මෙම සම්මන්ත්‍රණ / වැඩමුළු පැවැත්වීමේ අරමුණ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ තොරතුරු බෙදා හැරීම හා ආදායම් උත්පාදනයයි.

<u>විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය</u>

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල

හැඳින්වීම

ක්‍රෝලර් ට්‍රැක්ටර්ස්, ලෝඩර්ස්, එක්ස්කැවේටර්, මෝටර් ග්‍රේඩර්ස් වැනි ඉදිකිරීම් උපකරණවල ආරක්ෂාව, මූලික නඩත්තුව සහ මෙහෙයුම් තාක්ෂණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල පුහුණුව ලබා දෙයි. ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල සතුව ඉදිකිරීම් උපකරණ 61 ක පද්ධතියක් සහ පුහුණු නිළධාරීන් හා ප්‍රදර්ශක නිළධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇත.

පුහුණුවන්නන් සඳහා කුසලතා ලබාදීම සඳහා පුහුණු කාලයෙන් 70 % ක් පමණ ප්‍රායෝගික පුහුණුව සඳහා වෙන්කර ඇති අතර ඉතිරි 30% න්‍යායාත්මක කරුණු සඳහා සීමාවේ. පුහුණුවන්නන් සඳහා රැකියා පුහුණුව ලබාදෙන අතරම ආදායම් උත්පාදනය සඳහා සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දෙනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද ආකාරයට මෙහෙයුම් ශිල්පී විදුහලේ පුහුණු වැඩසටහන් ආයතනික පුහුණුවෙන් හා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක වන විට රැකියා පුහුණුවෙන් සමන්විත වේ. ආයතනික පුහුණුව අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් මාස 03 ක කාලයක් රැකියා පුහුණුව ලබා ගන්නා අභ්‍යාසලාභියෙකු NVQ සඳහා සුදුසුකම් ලබයි.



දැක්ම :

"ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින සියලුම පුහුණුකරුවන් සහ සේවාදායකයින් සඳහා ප්‍රමුඛ සේවාවන් ලබාදීමට කැපවුණු ශක්තිය තුළින් සහ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රම බලකායක් සැපයීම මඟින් වඩාත් ප්‍රමුඛතාවයකින් යුතු රාජ්‍ය සංවිධානය බවට පත්වීම"

මෙහෙවර :

"ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා බෙදාදීම සහ මෙහෙයුම් කටයුතු ලෙස දැනුම, නඩත්තුව සහ ඉදිකිරීම් උපකරණ කළමනාකරණය තුළින් දක්ෂ ශ්‍රම බලකායක් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ බිහිකිරීම සහ එමඟින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායීතාවයේ මැනිය හැකි වර්ධනයක් ලබාගැනීම"

අරමුණු :



- ස්ථාපිත ජාතික නිපුණතා ප්‍රමිතීන් සඳහා ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීම.
- යන්ත්‍ර හා අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ හා NVQ පරීක්ෂණ පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් හට තම කාර්යය කාර්යක්ෂමව හා ඵලදායීතාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත සඳහා යන්ත්‍ර හා උපකරණ කුලියට දීම.
- රාජ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි පාර්ශවකරුවකු වශයෙන් නවක ක්‍රියාකරුවන්ට අත්දැකීම් ලබාගැනීම මෙන්ම ජාතික සංවර්ධනයට දායක වීම.

පහත සඳහන් පුහුණු පාඨමාලා වර්තමානයේදී ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහලේ පවත්වනු ලැබේ.

1. ප්‍රාථමික පුහුණුව
   - 1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු ශිල්පය
2. කුසලතා සංවර්ධනය
   - 2.1 සැහැල්ලු ඉදිකිරීම් උපකරණ
   - 2.2 ඩම්ප් ට්‍රක්
   - 2.3 ෆාම් ට්‍රැක්ටර්
   - 2.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටින් රෝලර්
3. පස් ඉවත් කරන උපකරණ මූලික මොඩියුල
   - 3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්
   - 3.2 වීල් ලෝඩර්
   - 3.3 මෝටර් ග්‍රේඩර්
   - 3.4 හයිඩ්‍රොලික් එක්ස්කවේටර්
   - 3.5 බැක්හෝ ලෝඩර්
   - 3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්
4. විශේෂිත උපකරණ
   - 4.1 මොබයිල් ක්‍රේන්
   - 4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්
   - 4.3 ෆෝක් ලිෆ්ට් ට්‍රක්
   - 4.4 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්

5. වෘත්තීය පරීක්ෂණ

5.1 NVQ පරීක්ෂණ

5. සේවා අවශ්‍යතා මත සිදු කරන ලද පුහුණු වැඩසටහන්

ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවයට අනුව, මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම හා ට්‍රක් සවිකර ඇති දොඹකර ක්‍රියාකරු පුහුණු වැඩසටහන් 2019 වර්ෂයේදී අභිමතකරණය කර ක්‍රියාත්මක කරන ලදී.

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහලේ පවත්වන සියලුම පුහුණු පාඨමාලා ගාස්තු අයකරන පාඨමාලා වන අතර, ඒවායින් සමහර පාඨමාලා සඳහා පාසල් හැරගිය හා රැකියා විරහිත තරුණ තරුණියන් අතර ඉහළ ඉල්ලුමක් පවතී.

6. සම්මන්ත්‍රණ / වැඩමුළු

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල විසින් ඉදිකිරීම් කර්මාන්තයේ ඉල්ලුම මත ඉදිකිරීම් උපකරණ කළමනාකරණය හා අධීක්ෂණ වැඩසටහන් සහ නිපුණතා පරීක්ෂණ පවත්වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහායකයින් සඳහා විශේෂ දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වයි.

පුහුණු නිම කිරීම - 2019

2019 වර්ෂය සඳහා ඉලක්කගත අභ්‍යාසලාභී නිමැවුම් ප්‍රමාණය සහ එක් එක් පුහුණු වැඩසටහනට අදාළ ඉටුකර ගැනීම් පහත වගුවේ දක්වා ඇත.(වගුව I)

වගුව I :- පුහුණු නිම කිරීම - 2019

පුහුණු වැඩසටහන	නිම කිරීම - 2019	
	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගීත්ව සංඛ්‍යාව
1.0 ප්‍රාථමික පුහුණුව		
1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම	20	405
2.0 කුසලතා සංවර්ධනය		
2.1 පස් ඉවත් කිරීමේ උපකරණ මූලික මොඩියුලය		
ක්‍රෝලර් ට්‍රැක්ටර්	-	-
වීල් ලෝඩර්	02	04
මෝටර් ග්‍රේඩර්	05	30
හයිඩ්‍රොලික් එක්ස්කැවේටර්	07	66
බැකෝ ලෝඩර්	11	121

ස්කිඩ් ස්ටියර් ලෝඩර්	01	01
2.2 විශේෂිත උපකරණ		
මොබයිල් ක්‍රේන්	08	50
ප්ලාන් ට්‍රාන්ස්පෝටර්	04	20
ෆෝක් ලිෆ්ට් ඔපරේටර්	07	25
ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්	24	140
වෙනත්		
සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් රෝලර්	02	05
ඩම්ප් ට්‍රක්	03	04
සේවාදායකයාගේ අවශ්‍යතාවය මත සකස් කල පුහුණු වැඩසටහන්	04	121
එකතුව	98	992

<u>පුහුණු යටිතල පහසුකම් සංවර්ධනය</u>

Pax 200 ක ධාරිතාවයකින් යුත් නව දේශන ශාලාවක් ඉදිකිරීම.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සවිබල ගැන්වීමක් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ වඩාත් පුළුල් වගකීම් මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) සතුව ඇත. එබැවින් පාර්ශවකරුවන් සඳහා වැඩි සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට නව දේශන ශාලාවක් ඉදිකර ඇත.

එහි ඉදිකිරීම් අදියර අවසානයේ නව නවාතැන් පහසුකම්ද තිබෙන අතර සංවර්ධන වැඩසටහන් සඳහා දායක වන සම්පත් දායකයන් සඳහා නිසි පහසුකම් මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) හි ලැබෙනු ඇත.

<u>ඉදිකිරීම් උපකරණ කුලියට දීම</u>

ඉදිකිරීම් උපකරණ කුලියට දීම මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) විසින් සපයන ලද අතිරේක සේවාවකි. විද්‍යාලය සඳහා එය වැඩි ආදායමක් උත්පාදනය කරයි. පවත්නා යන්ත්‍ර ඇණිය භාවිතා කිරීම සඳහා පළමු ප්‍රමුඛතාවය පුහුණුව වන අතර, යන්ත්‍ර නිශ්කාර්යව පවතින විට යන්ත්‍ර කුලියට දෙනු ලැබේ.

<u>විරවිල නව අතිරේක පුහුණු පහසුකම් ස්ථාපිත කිරීම.</u>

1982 වර්ෂයේදී මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) ස්ථාපිත කරන ලද අතර, එය අනුරාධපුරය ගල්කුලම හි ක්‍රියාත්මක කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයට සේවා සලසන ලදී. දකුණු පළාතේ වැඩසටහන් අනුගමනය කරන ක්‍රියාකරුවන් අඩු බව නිරීක්ෂණය විය. එබැවින් 2017 වර්ෂය අවසානයේදී යන්ත්‍ර 3 ක පුහුණු මොඩියුල සහිත අතිරේක පුහුණු ඒකකයක් විරවිල ස්ථාපිත කරන ලදී. 2019 දී ක්‍රියාකරුවන් 23 ක් ඇතුලත්ව ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් එකතුව 70 ක් මෙහෙයුම් ශිල්පි විදුහල (OTC) විරවිල විසින් පුහුණු කරන ලදී.

2019 වර්ෂය තුලදී මෙහෙයුම් ශිල්පී විදුහලෙහි ආදායම

රැකියා කාණ්ඩය	ආදායම රු.
පුහුණු වැඩ(ගල්කුලම්) (විරවිල)	14,715,500.00 239,750.00
යන්ත්‍ර කුලියට දීම	5,951,000.00
NVQ පරීක්ෂණ	28,750.00
අභිමත නිර්මාණ	695,000.00
මෙහෙයුම්කරුවන්ගේ හැදුනුම්පත් විවිධ	296,250.00
වෙනත්	
එකතුව	21,926,250.00

ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු පුහුණු ඒකකය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයේ ඉදිකිරීම් උපකරණ නඩත්තු හා කළමනාකරණ පුහුණු ඒකකය, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) බත්තරමුල්ල, පැලවත්ත හි විජේසිංහ මාවත අංක 17 D ස්ථානයේ ස්ථානගතව ඇත. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා, නඩත්තු හා කළමනාකරණය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ඉතා හොඳින් සම්පාදනය කරන ලද ස්ථානයකි. මෙම මධ්‍යස්ථානයේදී ව්‍යාපෘති හා නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවරුන්, වැඩපොළ අධිකාරිවරුන්, වැඩපොළ අධීක්ෂකයින්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්, කාර්මිකයින්, යන්ත්‍ර උදව්කරුවන් සහ පාසල් හැරයන්නන් සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ.





❖ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්

1996 ඔක්තෝබර් සිට 2001 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළදී ජපාන විශේෂඥයන්ගේ සහාය සහිතව ඉදිකිරීම් උපකරණ පිළිබඳ නඩත්තුව සඳහා CETRAC පුහුණු වැඩසටහන් ආරම්භකව සංවර්ධනය කරන ලදී. ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්ද CETRAC හි පැවැත්වීම සඳහා සිඩා (CIDA) විසින් ආරම්භ කර ඇත.

- කර්මාන්තයට නවකයන් සඳහා පාඨමාලා

යොවුන් විරැකියාව පිළිබඳ ගැටලුව විසඳීම සඳහා පාසල් හැරගිය අය සඳහා වැඩි වෘත්තීය පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීමට හා පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

- ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව

ඉදිකිරීම් උපකරණ කාර්මික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ සහයෝගිත්වයෙන් සිදු වේ. එය වර්ෂ 02 ක පාඨමාලාවක් වන අතර එය CETRAC හි මාස 12 ක ආයතනික පුහුණුවකින් සහ කර්මාන්තයේ මාස 12 ක රැකියා පුහුණුවකින් සමන්විත වේ. අ.පො.ස. (සා/පෙළ) සහිත පාසල් හැර යන්නන් මෙම පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. මෙම පුහුණු පාඨමාලාවෙන් නව ඉදිකිරීම් උපකරණ පිළිබඳ සියලුම අලුත්වැඩියා හා නඩත්තු අංශ ආවරණය කෙරේ. වාර්ෂික බඳවාගැනීම් පුහුණුවන්නන් 120 වේ.

පුහුණුවන කාල පරිච්ඡේදය තුලදී නොමිලේ නවාතැන්, පාඨමාලා ද්‍රව්‍ය, වැඩමුළු පහසුකම්, නිල ඇඳුම් සහන මිලට ආහාර සහ ආරක්ෂිත ආමපන්න ආදිය මෙම පුහුණුවන්නන්ට ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහනේ පෙර සිටි අභ්‍යාසලාභීන් සියලු දෙනාම පාහේ දේශීයව මෙන්ම විදේශයන්හිද වාසිදායක අයුරින් සේවය කරනු ලැබේ. ඔවුන්ගෙන් ඇතැමෙක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා තමන්ගේම වැඩපොළවල් පිහිටුවා ඇත.

මෙම වැඩසටහන සාර්ථකව නිමකල අභ්‍යාසලාභීන්ට NVQ- 4 මට්ටමේ සහතිකය ප්‍රදානය කෙරේ.

❖ සේවක නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීමේ යෙදී සිටින කාර්මිකයින්, අධීක්ෂකයින් හා කළමණාකරුවන්ගේ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. එක් එක් අභ්‍යාසලාභියා සඳහා පුද්ගලික අවධානය යොමු කිරීමේ අරමුණින් අභ්‍යාසලාභීන් බඳවාගැනීම එක් කාණ්ඩයකට 12 බැගින් සීමා වේ. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

- **කණිෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩපොළවල සේවයේ යෙදී සිටින කණිෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී. මෙම පාඨමාලා හැදෑරීම සඳහා වර්ෂ 02 සිට 05 දක්වා පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයින් තම පුහුණු අවශ්‍යතා මත ඔවුන්ගේ කාර්මිකයන් ඕනෑම මොඩියුලයකට එවිය හැකි වන ලෙස මෙම පාඨමාලා විවිධ මොඩියුලවලට බෙදා වෙන් කර ඇත. හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුල වලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවති. එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.

- **ජ්‍යෙෂ්ඨ කාර්මිකයින් සඳහා පුහුණු පාඨමාලා**

ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සහ වැරදි හඳුනාගැනීම හා නිවැරදි කිරීම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සඳහා මෙම උසස් පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. වර්ෂ 05 කට වඩා පළපුරුද්දක් ඇති කාර්මිකයින් මෙම පාඨමලාව සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබයි. සේවායෝජකයන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව, ඕනෑම තෝරාගත් මොඩියුලයකට තම කාර්මිකයින් යැවීමට හැකිවන පරිදි මෙම පුහුණු පාඨමාලා විවිධ මොඩියුල 6 කින් සමන්විත වේ . හයිඩ්‍රොලික්ස් සහ මෙකාට්‍රොනික්ස් වැනි මෙම මොඩියුල වලින් ඇතැම් මොඩියුල සඳහා කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එබැවින් මෙම මොඩියුල සඳහා සමහර විට අතිරේක පාඨමාලා පැවැත්විය යුතු වේ.





- **අධීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහන්**

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම සඳහා වගකිව යුතුවන වැඩපොළ අධීක්ෂකවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා අධීක්ෂක පුහුණු වැඩසටහන් නිර්මාණය කර ඇත. වර්ෂ 02 ක අදාළ පළපුරුද්ද සහිත අධීක්ෂකවරුන් මෙම පාඨමාලා සඳහා බඳවා ගැනේ.

- **ඉංජිනේරුවරුන් / කළමණාකරුවන් සඳහා පුහුණු වැඩසටහන්**

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම සඳහා සම්බන්ධවන ඉංජිනේරුවන්, වැඩපොළ කළමණාකරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම පිළිබඳ සිවිල් ඉංජිනේරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම් ලබාදීම සඳහා ඉදිකිරීම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව නිර්මාණය කර ඇත. වසර 02 ක පළපුරුද්දක් තිබෙන ඉංජිනේරුවන් මෙම පාඨමාලාව සඳහා බඳවාගැනීම සිදු කරයි.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යාන්ත්‍රික ඉංජිනේරුවන්ට සහ ඉදිරිපෙළ කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම් ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සහභාගිවන්නන්ට වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.





- සහය කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ සේවය කරන ගබඩා/ සැපයුම්/ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමානුකූල පුහුණුවක් සඳහා අවස්ථාවක් නොමැත. මෙය උපකරණ අලුත්වැඩියා කිරීමේ වෙළඳසැල්වල සුමට ක්‍රියාකාරිත්වයට බාධාවක් වන විවිධ මෙහෙයුම් ගැටලු වලට තුඩු දී ඇත. මෙම පුහුණු අවශ්‍යතාවය සපුරාලීම සඳහා පුහුණු වැඩසටහන් සකස් කරන ලදී.

- ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන්

ගොඩනැගිලි සේවා ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා වැඩසටහන් කිහිපයක් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු පුහුණු මධ්‍යස්ථානය (CETRAC) විසින් පවත්වනු ලැබේ.

වාණිජ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන මෙම ගොඩනැගිලි සේවා ආවරණය කිරීම සඳහා පුහුණු පාඨමාලා කිහිපයක් නිර්මාණය කර ඇත. ඒවා ගිනි ආරක්ෂණ පද්ධති, විදුලි පද්ධති, වායු සම්කරණ සහ වාතාශ්‍ර පද්ධති, ජල සම්පාදන පද්ධති හා ජල ප්‍රවාහන පද්ධති ආදිය ආවරණය කරයි.

- පාරිභෝගිකයන් අරමුණු කරගත් පුහුණු වැඩසටහන්

ලබාගත් අත්දැකීම් සමඟ රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි අභිමතකරණය කරන ලද පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීමෙන් පුහුණුවීම්වල විවිධ සහ විශේෂිත ඉල්ලුම සාර්ථකව සපුරාලීමට ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු නඩත්තු මධ්‍යස්ථානයට (CETRAC) හැකි වී තිබේ.

ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) 2019 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

වගුව :- I- 2019 වර්ෂයේ CETRAC හි කාර්ය සාධනය

පුහුණු පාඨමාලා	ලියාපදිංචි වූ		සමත් වූ	
	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	පාඨමාලා සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
.01පාසල් හැරයන්නන් (1 මට්ටම) ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලාව)CFM)	06	330	02	155
පුහුණු පාඨමාලා	ඉලක්කගත පාඨමාලා සංඛ්‍යාව	නිමැවුම සඳහා සහභාගි වූ සංඛ්‍යාව	කත්ය පාඨමාලා සංඛ්‍යාව	නිමැවුම සඳහා සහභාගි වූ සංඛ්‍යාව
02 කණිෂ්ඨ කාර්මිකයින්				
ඩීසල් එන්ජින් නඩත්තු කිරීම	1	15	1	9
හයිඩ්‍රොලික් පද්ධතිය නඩත්තු කිරීම (19M22)	1	20	1	20
ඩිසල් ජෙනරේටර් නඩත්තු කිරීම (19M25)	1	25	2	13
ඉලෙක්ට්‍රොනික් නඩත්තු කිරීම හා ඉදිකිරීම් උපකරණ මෙකාට්‍රොනික්ස් නඩත්තු කිරීම (19MT)	1	15	2	13
ජලනල හා කම්ප්‍රෙෂර් නඩත්තු කිරීම (19WPC)	1	15	1	11
ඔක්සි - ඇක්සටලීන් ගෑස් වෙල්ඩින් හා මැනුවල් ආර්ක් වෙල්ඩින් (190AGW)	1	20	2	21
03. ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්				
හයිඩ්‍රොලික් හා මෙකාට්‍රොනික්ස් පද්ධති නඩත්තු කිරීම (19M32)	1	15	1	12
ඔටෝ ඉලෙක්ට්‍රිකල් පද්ධති නඩත්තු කිරීම (19M34)	1	15	1	11
04. සහය කාර්ය මණ්ඩලය				
සහය කාර්ය මණ්ඩලය සඳහා ගබඩා තබාගැනීම, සැපයුම් දාමය සහ ගබඩා කළමනාකරණය සඳහා මූලික පාඨමාලාව	1	15	1	25
ගබඩා තබාගැනීම, සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	1	20	1	29
ගබඩා තබාගැනීම, සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	1	15	2	31
ආයතනික ගබඩා කළමනාකරණය, බැහැර කිරීමේ ක්‍රියා පරිපාටි ප්‍රසම්පාදන	1	25	1	70

කළමනාකරණය පිළිබඳ එක් දින වැඩසටහන				
ආයතනයේ සුළු කාර්ය මණ්ඩලයට රාජකාරි, ආගන්තුක සත්කාරය සහ ආචාරධර්ම සම්බන්ධතා පිළිබඳ එක් දින වැඩමුළුව	2	45	2	129
05. අභිමත සැලසුම් කරන කරන ලද පාඨමාලා (CET)				
මෙහෙයුම් ජංගම දොඹකරය	1	20	1	4
ෆෝක් ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 02)	1	25	5	12
ෆෝක් ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 03)	1	16	3	9
ෆෝක් ලිෆ්ට් ක්‍රියාකරු පුහුණුව (දින 05)	1	25	4	11
කාර්මිකයින් සඳහා හයිඩ්‍රොලික් පද්ධති නඩත්තු කිරීම	1	15	1	1
කණ්ඩායම් ඵලදායීතාවය සහ ඵලදායීතා වැඩි දියුණු කිරීම	1	40	2	60
හයිඩ්‍රොලික් සහ ඉලෙක්ට්‍රෝ හයිඩ්‍රොලික් පාලන පද්ධති	1	25	1	13
දොඹකර ක්‍රියාකරුවන් සඳහා ආරක්ෂිත වැඩසටහන	2	60	1	50
යන්ත්‍ර මෙහෙයුම් පිරිවැය සහ කාලය අඩු කරගන්නේ කෙසේද?	1	30	1	39
06. අභිමත පාඨමාලා සැලසුම් (BSI)				
සක්‍රීය හා උදාසීන ගිනි ආරක්ෂණ පද්ධති	1	30	1	34
ගොඩනැගිලි විදුලි පද්ධති සැලසුම් කිරීම ස්ථාපනය කිරීම, මෙහෙයුම් කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	1	20	1	32
ආරක්ෂිත වැඩ පරිසරය ස්ථාපිත කිරීම සඳහා ආපතති කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	1	15	1	4
උස් ගොඩනැගිලි සඳහා ජලනල පද්ධති වැඩමුළුව	1	20	1	15
HVAC පද්ධති	1	25	1	25
පිහිනුම් තටාක නඩත්තු කිරීම	1	40	1	66
සෝලර් PV පද්ධති	1	40	2	87
මහජන ඇමතීම හා ශබ්ද කළමනාකරණය	1	20	1	24
වැසි ජල අස්වනු	1	20	1	15
සක්‍රීය හා උදාසීන ගිනි ආරක්ෂණ පද්ධති	1	30	1	33
ගොඩනැගිලි ස්වයංක්‍රීයකරණ පද්ධති	1	20	1	26
හරිත ගොඩනැගිලි සැලසුම් කිරීම සහ සහතික කිරීම	-	-	1	49
CCTV පද්ධතියේ සැලසුම් අංශ	-	-	1	31
වහල මත සූර්ය පීවී පද්ධති පිළිබඳ වැඩමුළුව	-	-	1	22
07. වැඩමුළු හා සම්මන්ත්‍රණ				
ප්‍රවාහන කළමනාකරණය	1	110	2	130
රියදුරු පුහුණු වැඩසටහන්	1	120	2	182

ඉදිකිරීම් උපකරණ සඳහා හැඳින්වීම	1	110	1	90
ආරක්ෂිත, විද්‍යාත්මක හා ආර්ථික රිය පැදවීම	1	120	2	175
පරිපාලන නීති හා මානව සම්පත් සංවර්ධනය	1	100	1	39
ආයතනික ප්‍රසම්පාදන හා සැලසුම් දාම කළමනාකරණය	1	110	1	92
ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර	1	100	1	16
බර උපකරණ භාවිතය සහ කාර්ය සාධනය	1	60	1	32
කම්කරු දෙපාර්තමේන්තුව සඳහා රියදුරු පුහුණුව - කණ්ඩායම 1 සහ2	1	100	2	60
ජෙනරේටර් ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම	1	120	2	132
වාහන භාවිතය	1	110	1	67
සේවක කළමනාකරණය හා කම්කරු රෙගුලාසි	-	-	1	37
බර යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම හා නඩත්තු කිරීම සහ වැඩ ඇස්තමේන්තු පිළියෙල කිරීම	-	-	1	33
ජෙනරේටර් ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම පිළිබඳ දින 2 ක වැඩමුළුව	--	-	1	66
ආරක්ෂිත විද්‍යාත්මක හා ආර්ථික රිය පැදවීම පිළිබඳ දින 2 ක වැඩමුළුව	-	-	1	50
ඵලදායී ක්‍රියාවලියක් සඳහා සේවකයන් මෙහෙයවන්නේ කෙසේද?	-	-	1	58
එකතුව	**53**	**2296**	**35**	**2496**

2019 වර්ෂ තුල උපයාගත් ආදායම

රැකියා කාණ්ඩය	ආදායම රු. මිලියන
පුහුණු වැඩසටහන් වැඩමුළු හා සම්මන්ත්‍රණ	21.77
වැඩපොළ අලුත්වැඩියා කිරීමේ රැකියා සහ වෙනත් වැඩපොළ සේවා	5.08
පහසුකම් කුලියට දීම	7.85
	34.70

කර්මාන්ත පුහුණු අංශය

පසුගිය වසර 03 තුළ පෙර නොවූ විරූ හා අසමසම වර්ධන වේගයක් වාර්තා කරමින් සිටින ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා පුහුණු මානව සම්පත් ඇති බව සහතික කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන්ගේ හැකියාවන් ගොඩනැගීම සඳහා කර්මාන්ත පුහුණු අංශය කැපවී සිටී.

ඉදිකිරීම් කර්මාන්තය වර්තමානය වන විට නිපුණ ශ්‍රම හිඟයක් අත්විඳිමින් සිටින අතර මෙම නැගී එන දැවැන්ත වර්ධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ ශ්‍රම බලකායේ ධාරිතා වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් නියෝජනය වන පුහුණු අංශය කැප වී ඇත්තේ කර්මාන්තයේ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා ය.

2019 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන්

❖ **ඉදිකිරීම් අංශයේ නිපුණතා සංවර්ධනය [මිලියන 300 වැඩසටහන]**

පෙදරේරු, වඩු කාර්මිකයන්, ජලනල කාර්මිකයන්, ටයිල් අතුරන්නන් යනාදී ශිල්පීන්ගේ විශාල හිඟයක් පවතින අතර එය ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාල රාමු තුළ උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගනිමින් නිසි ලෙස නිම කිරීමට අහිතකර ලෙස බලපායී.

ඉදිකිරීම් කර්මාන්තය විසින් දැනට අත්විඳින මෙම තත්ත්වය, කෙටිම කාලසීමාව තුළ වර්තමාන හිඟය සපුරාලීම සඳහා කෙටි පුහුණු වැඩසටහන් වල අවශ්‍යතාවය තවදුරටත් තහවුරු කරයි.

ඉදිකිරීම් කර්මාන්තයේ මෙම ගැටළුව විසඳීම සඳහා ආධුනිකත්ව මණ්ඩලය (NAITA) සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) සමඟ සහයෝගයෙන් රැකියා පුහුණු වැඩසටහන කෙටිකාලීනව ක්‍රියාත්මක කිරීමේදී සිඩා (CIDA) විසින් ඉදිකිරීම් කර්මාන්තයේ ඉහළම ආයතනය වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.



පෙදරේරු, වඩු කර්මාන්තය, ටයිල් කිරීම, බාර් නැමීම සහ විදුලි යනාදී කර්මාන්ත වල එම 6000 ක් පමණ ශිල්පීන් පුහුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට රජය විසින් රු. මිලියන 300 ක මුදලක් ඉහත කී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය හරහා සිඩා වෙත වෙන් කර තිබුණි. තෝරාගත් අභ්‍යාසලාභීන්ගේ අභිප්‍රේරණය ඇති කිරීම සඳහා පුහුණුවීම් කාලය තුළ ඔවුන්ගේ දෛනික වියදම් පියවා ගැනීමට මසකට රු. 10,000 බැගින් මාස 3 ක කාලයක් සඳහා දීමනාවක්ද පිළිගත් ඇදුම් පැළඳුම් සහිතව ස්වයං රැකියා සඳහා මෙවලම් කට්ටලයක්ද ලබාදෙන ලදී.

❖ **කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව**

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන කළමනාකරණය කටයුතුවල නියැලී සිටින කළමනාකරණ සහ අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩලයේ කළමනාකරණ දැනුම සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා සිඩා වාර්ෂික කොන්ත්‍රාත් කළමනාකරණ හා ප්‍රසම්පාදන කළමනාකරණ පිළිබඳ

ඩිප්ලෝමාව යන පුහුණු වැඩසටහනක් සංවිධානය කරයි. 2019 වර්ෂය සඳහා වන වැඩසටහන 2019 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල 33 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබිය.

❖ **කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු අංශය විසින් වාර්ෂිකව "කොන්ත්‍රාත් කළමනාකරණ සහතික පාඨමාලාව" නමින් පුහුණු වැඩසටහනක් සංවිධානය කරයි. මෙම වැඩසටහන සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. 2019 වර්ෂයේදී වැඩසටහන් 5 ක් මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබිය. කොන්ත්‍රාත් කළමනාකරණය පරිපාලනය පිළිබඳව කොන්ත්‍රාත්කරුවන් 173 දෙනෙකු ඔවුන්ගේ ධාරිතාවය වර්ධනය කර ගනිමින් පුහුණුව ලැබිය.

❖ **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍ය (CSOH)**

අවසාන ප්‍රතිඵලවල ඉණාත්මකභාවය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහිත ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය ක්‍රමයෙන් නවීකරණය වෙමින්, සංකීර්ණ ඉදිකිරීම් ශිල්පීය ක්‍රම හා ක්‍රමවේදයන් කරා ගමන් කරයි. ජීවිත හා දේපළවලට හානි සිදුවන වැඩ ආශ්‍රිත අනතුරු අවම කිරීම සඳහා වැඩබිම් ඉදිකිරීම් ආශ්‍රිත ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය බව වටහාගෙන ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සෞඛ්‍ය අංශය සමඟ සහයෝගිත්වයෙන් සිඩා (CIDA) විසින් පහත සඳහන් මට්ටම් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් සකස් කර ඇත.

- **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DS&OH)**

මෙම සති පනස් දෙකක පුහුණු වැඩසටහන, ඉදිකිරීම් වැඩබිම්වල හොඳම සෞඛ්‍ය හා ආරක්ෂාව භාවිතයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිසි දැනුමක් හා කුසලතා ලබා දෙමින්, අධීක්ෂණ මට්ටමේ සේවකයින් ඉලක්ක කර ගනිමින් සතියකට දින දෙකක් ලෙස පවත්වන ලදී. ඉදිකිරීම් ස්ථානවල පිළිවෙත් දීම. 2019 වර්ෂයේ මෙම වැඩසටහන සඳහා 33 දෙනෙකු සහභාගි විය.

- **ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ සහතික පාඨමාලාව (CS&OH)**

පුහුණු අංශය විසින් ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් වාර්ෂිකව සංවිධානය කරයි. මෙය සති විසිහතරක පුහුණු වැඩසටහනක් වන අතර සතියකට එක් දිනක් පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් දෙක සඳහා 43 දෙනෙකු සහභාගි විය.

❖ **ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ශිල්ප හැඳුනුම්පත් නිකුත් කිරීම**

සිඩා පනතට අනුව සියලු ඉදිකිරීම් ශිල්පීන් (පෙදරේරුවන්, වඩු කාර්මිකයන් සහ ජලනල කාර්මිකයන් ආදී) සතුව ශිල්ප හැඳුනුම්පතක් තිබිය යුතුය. ඔවුන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සහ වැඩි දියුණු කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ නිසි පිළිගැනීමක් ලබා දීම සඳහා "පුහුණු පුද්ගලයින්" ලියාපදිංචි කිරීමට අදාළ පනතේ විධිවිධාන ඇත. අයදුම්පත් පහත සඳහන් කාණ්ඩ යටතේ සකස් කරන ලදී.

1. පුහුණු ඉදිකිරීම් ශිල්පී

පුහුණු ඉදිකිරීම් ශිල්පීන්ට පහත පරිදි ප්‍රධාන කාණ්ඩ දෙකකින් ශිල්පී හැඳුනුම්පත් නිකුත් කළ යුතුය.

i. ශිල්පී
ii. ප්‍රධාන ශිල්පී

තෝරාගත් ශිල්ප පහත පරිදි වේ:

- ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)
- විදුලි කාර්මික
- දැව ශිල්පී (ගොඩනැගිලි)

- ජලනල කාර්මික
- දැව ශිල්පී (ගෘහ භාණ්ඩ)
- බාර් නැවුම්කරු
- ටයිල් අතුරන්නන්
- පෑස්සුම්කරුවන්
- පින්තාරුකරු (ගොඩනැගිලි)
- ඇලුමිනියම් ෆැබ්රිකේටර්
- වෙනත්

නිවාස සැලසුම් කිරීම සහ ගොඩනැගිලි පිළිබඳ මධ්‍යස්ථානය

නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) යනු ISO 9001: 2015 සහතිකලත් ආයතනය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අංක POI / 054 සහිත සිඩා කළමනාකරණ බල සීමාව යටතට එන බහු ශික්ෂණ ආයතනයකි. මෙම ආයතනය බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 33 හි පිහිටා ඇත. තාක්ෂණවේදීන්ගේ සහ වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලා පැවැත්වීම නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB) විසින් අවධාරණය කරයි. මෙම තාක්ෂණික සැසි සඳහා ලැබෙන අනිමහත් ප්‍රතිචාරය, වඩාත්ම වටිනා පාඨමාලා පැවැත්වීමේ දී නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයෙහි (CHPB) වෘත්තියභාවය පිළිබඳ ලැබෙන සාක්ෂියකි.





❖ **නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ (CHPB) පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් හා ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයන් සඳහා භිදැස් පිරවීමේ පුහුණු වැඩසටහන් නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය(CHPB) විසින් සපයයි. අපගේ ප්‍රධාන ඉලක්ක කණ්ඩායමට, ඉදිකිරීම් කර්මාන්තය ගැන කැමැත්තක් දක්වන විධායක නිළධාරීන්, ඉංජිනේරුවන්, උනන්දුවන්නන්, ඉදිකිරීම් කළමනාකරුවන් සහ පාසල් හැරගිය අය ඇතුළත් වේ.

අධීක්ෂකයින් ලෙස භූ දර්ශන ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට කැමත්තක් දක්වන පාසල් හැරගිය අය සහ තරුණ උද්යෝගය දක්වන්නන් සඳහා භූ දර්ශන සංවර්ධන සහකාර (NVQ 4) පාඨමාලාව නිර්මාණය කර ඇත.

අභ්‍යන්තර නිර්මාණ වැඩසටහන් කාණ්ඩ දෙකක් යටතේ පවත්වනු ලැබේ. එනම්, පාසල් හැරගිය අය සඳහා අභ්‍යන්තර අලංකරණ ශිල්පී (NVQ 4) සහ ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර නිර්මාණ ක්ෂේත්‍රයේ සේවකයන් ඉලක්ක කරමින් අභ්‍යන්තර සැලසුම් ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රමාණ සමීක්ෂණ වැඩසටහන් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා යන කාණ්ඩ දෙක යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. පළපුරුදු ඉදිකිරීම් වැඩ අධීක්ෂකවරු, තාක්ෂණික නිලධාරීන්, සහකාර

තාක්ෂණ නිලධාරීන් සහ සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන්නන් ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉලක්ක කෙරේ. ප්‍රමාණ සමීක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NVQ 4) හා ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) විෂය මාලාව මත පදනම්ව ව්‍යුහගත කර ඇත.
3	කාර්යාල අවශ්‍යතා	207,728.30	598,967.92
4	මුද්‍රණ, යතුරු ලියන හා පරිවර්තන	400,190.00	479,402.10
5	පොත් හා වාර සඟරා	687,833.64	587,083.14
6	අපහරණ හා විනාශ කිරීම්	62,296.11	265,012.61
7	ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	61,940.33	48,602.04
	එකතුව	13,193,429.57	8,917,446.35

සටහන 28 - නඩත්තු වියදම්

අංකය	විස්තරය	2019 රු	2018(යලි ප්‍රකාශිත) රු
1	ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,450,963.41	8,687,008.26
2	ලි බඩු හා කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,809,087.01	4,218,058.40
3	මගී වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,930,430.51	3,967,220.19
4	වෙනත් වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	514,019.14	124,942.70
5	පිරියක, යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	2,549,895.03	2,786,482.48
6	මෙවලම් අලුත්වැඩියා කිරීම සහ ක්‍රියාත්මක කිරීම	-	2,488.05
7	වෙනත්/ තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	971,180.37	4,005.00
8	රක්ෂණ (වාහන)	3,017,826.21	2,278,930.61
	එකතුව	15,243,401.67	22,069,135.70

සටහන 29 - ඉන්ධන හා උපයෝගිතා ගෙවීම්

අංකය	විස්තරය	2019 රු	2018(යලි ප්‍රකාශිත) රු
1	මගී වාහනවල ඉන්ධන හා ධාවන වියදම්	6,922,353.88	7,954,466.40
2	වෙනත් වාහනවල ඉන්ධන හා ධාවන වියදම්	1,659,616.62	2,279,219.67
3	කුලි හා කුලි ගාස්තු	950,548.12	1,221,644.91
4	කැපැල්	1,367,015.38	1,089,870.58
5	දුරකතන ගාස්තු	2,415,364.80	2,492,327.60
6	අන්තර්ජාල ගාස්තු	1,148,600.51	586,037.46
7	විදුලි බල ගාස්තු	10,460,452.59	11,663,977.32
8	ජල ගාස්තු	1,629,307.70	1,457,504.40
9	සෞඛ්‍ය හා සනීපාරක්ෂණ	5,501,297.08	5,228,477.77
10	ආරක්ෂක සේවා	4,737,150.00	4,232,571.23
	එකතුව	36,792,006.68	38,206,097.34

සටහන 30 - පර්යේෂණ, සංවර්ධන හා පුහුණු වියදම්

අංකය	විස්තරය	2019 රු	2018(යලි ප්‍රකාශිත) රු
1	අලුත් කිරීමේ ගාස්තු - TVEC	4,000.00	1,500.00
2	ශිෂ්‍යත්ව හා පුහුණු - (දේශීය)	279,100.00	819,300.00
3	ශිෂ්‍යත්ව හා පුහුණු - (විදේශීය)	293,240.61	392,383.59
4	වැඩ බිම්වලට යෑමේ දීමනාව	1,116,806.30	1,303,750.00
5	උපදේශකවරුන්ට ගාස්තු හා දීමනා	628,765.00	629,327.26
6	ඉගැන්වීමේ කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා	12,258,844.00	11,101,623.50
7	සහාය කාර්යමණ්ඩලයට ගාස්තු හා දීමනා	170,635.45	43,500.00
8	සංවර්ධන පිරිවැය	507,912.50	390,600.00
9	පුහුණු ද්‍රව්‍ය	202,667.28	169,579.14
10	පුහුණු සඳහා ඉන්ධන	2,182,144.44	2,691,257.90
11	පුහුණු ආධාර	2,000.00	2,100.00
12	අත් මෙවලම් හා කුඩා උපකරණ	284,540.68	79,605.17
13	පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම්	11,203.31	992,004.34
14	පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන	10,363,033.00	10,363,689.00
15	වෙනත් - පුහුණු	19,435.00	140.00
16	විශේෂ කාර්යයන් සඳහා වියදම්	-	11,825.00
17	පුහුණුවන්නන් සඳහා මුදල් දීමනා	2,168,250.00	2,625,725.00
18	උපකරණ සඳහා කුලිය	181,550.00	280,675.00
19	සේවක සුභ සාධන	172,000.00	160,605.00
20	ශාලා ගාස්තු	294,746.00	1,825,550.00
21	වෙබ් පදනම ඉදිකිරීම් ලියාපදිංචි කිරීමේ වියදම්	896,500.00	737,000.00
	එකතුව	**32,037,373.57**	**34,621,739.90**

සටහන 31-මූල්‍ය පිරිවැය

අංකය	විස්තරය	2019 රු	2018(යලි ප්‍රකාශිත) රු
1	බැංකු ගාස්තු	543,154.00	215,107.39
2	කල්බදු පොලිය -මුල් කල්බදු	3,660,635.39	-
	එකතුව	**4,203,789.39**	**215,107.39**

සටහන 32- ක්ෂය වීම

මුළුමනින්ම අවප්‍රමාණය කළ දේපල, සැලැස්ම සහ උපකරණ

මුළුමනින්ම අවප්‍රමාණය කළ දේපල, සැලැස්ම සහ උපකරණ, වාර්තා කිරීමේ දිනය වන විටත් භාවිතා කෙරෙන ඒවා පහත පරිදි වේ.

ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ - රු.4,251,259.57

සටහන 33

අංකය	විස්තරය	2019 රු	2018(යලි ප්‍රකාශිත) රු
1	ජාතික ගොඩනැගීමේ බදු (NBT)	3,619,872.00	3,870,910.00
2	සේවකයන් සඳහා නිල ඇඳුම්	1,186,524.76	1,354,547,06
3	සේවකයන් සඳහා තේ	2,030,825.83	2,337,216.00
4	සෞඛ්‍ය රක්ෂණ	2,860,457.37	1,067,665.32
5	වෙනත්	32,866.57	18,350.00
6	සුභසාධන	240.00	-
7	ප්‍රදර්ශන	292,235.60	181,073.50
8	දැන්වීම් හා ප්‍රචාරණ	5,466,149.48	4,088,922.31
9	ආහාර පාන	1,427,402.78	1,212,488.33
10	ආසන දීමනා	3,387,400.00	2,382,575.00
11	විගණන ගාස්තු	908,113.00	860,000.00
12	සේවා කොන්ත්‍රාත්	81,632.66	-
13	නෛතික ගාස්තු	121,000.00	159,612.50
14	වන්දි		593,340.00
15	VRS වන්දි		19,174,303.75
16	බලපත්‍ර ගාස්තු	463,991.67	499,212.13
17	විවිධ වියදම්	270,947.89	274,569.45.
18	වරිපනම් බදු	85,157.30	87,273.89
19	කල්බදු ක්‍රමක්ෂය	32,613.64	32,613.64
20	තාවකාලික නවාතැන්	156,245.00	836,589.35
21	වත්කම් අපහරණ පාඩු	-	369,529.91
22	අසම්භාව්‍ය වියදම්	-	500,000.00
23	රදවා ගැනීමේ බදු වියදම්	113,000.00	30,000.00
24	නවාතැන් සඳහා දෛනික වියදම්	4,000.00	-
25	අඩමාන ණය ඌන ප්‍රතිපාදනය	643,605.55	-
	එකතුව	**23,184,281.10**	**39,930,792.00**

භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන (පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය කිරීම, ඉදිකිරීම් උපකරණ කාර්මික පාඨමාලා) සහ ප්‍රාග්ධන සඳහා අග්‍රිමය (රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව ආදර්ශය වැඩසටහන් සහිත ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා පුහුණු) ප්‍රාග්ධන වැය යටතේ මුදල් අමාත්‍යාංශය විසින් මූල්‍යයනය කරන ලදී. තවද අදාළ වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් හා අදාළ වර්ෂයේ ආදායම තාර්කික පදනමක් මත සමාන මුදලකින් හඳුනාගත යුතු අතර එමආදායම හා වියදම සිඩා ගිණුම්කරණ ප්‍රතිපත්තියට (ප්‍රාග්ධන ප්‍රදාන) අනුව අදාළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනම දැක්විය යුතුය.

සටහන 34

ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වරලත් ගිණුම් ආයතනය(ICASL) විසින් නිකුත් කරන ලද පරිදි සිඩා හි ප්‍රතිස්ථාපිත මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත්තේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට (SLPSAS) අනුකූලව ය. අවශ්‍ය නොවන ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා රුපියල් වලින් (RS) ඉදිරිපත් කළ හොත් වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් වල වෙනස්වීම් වලට අනුකූලව යම් සංසන්දනාත්මක ප්‍රමාණයක් නැවත වර්ගීකරණය කර ඇත. 2018 ජනවාරි 01 දා සිට තවදුරටත් විස්තර කර ඇති පරිදි සීඅයිඩීඑස්එල්පීඑස්එස් සම්මත කළේය 3. 2018 දෙසැම්බර් 31 දක්වා වූ නැවත පිහිටුවීමේ සමස්ත සමුච්චිත බලපෑම නම් එම කාලය සඳහා අතිරික්තය 2,250,991.70 කින් අඩු කිරීමයි.

SLPSAS අනුව යථා තත්ත්වයට පත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, වාර්තා කරන ලද වත්කම් හා බැරකම් ප්‍රමාණයට බලපාන යම් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම සහ වාර්තා වන දිනවල ආදායම් හා වියදම් ප්‍රමාණය වාර්තා කිරීම වාර්තා කරන වර්ෂය. සත්‍ය ප්‍රතිඵලය මෙම තක්සේරුවලට වඩා වෙනස් විය හැකිය.

3. 5 විගණකාධිපති වාර්තාව

මගේ අංකය- සිරිඑන්/බි/සිඅයිඩිජී/2/19 2020 සැප්තැම්බර් 04 දින

සභාපති
ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

1.මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දැක්වෙන කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති - 1 හි (ශ්‍රී ලං. රා. ගි.ප්‍ර.) විධිවිධාන වලට පටහැනිව ණය හිමි උපලේඛනයේ එකතුව වූ රු. 1,303,499 ක හර ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි. තවද එම දිනට වූ මෙම ශේෂය තුල රු. 71,375 ක් සහ රු. 30,087 ක පිළිවෙලින් අසාමාන්‍ය හර හා බැර සුළු මුදල් අග්‍රිම ශේෂයන් සහ රු. 387,218 ක හා රු. 261,026 ක විශේෂ අත්තිකාරම් ඇතුලත් වී තිබුණි.

ආ) පෙර වර්ෂය හා ඉදිරි වර්ෂය වෙනුවෙන් ශ්‍රවණාගාරය හා සම්මන්ත්‍රණ කාමර කුලියට දීමෙන් 2019 වර්ෂය තුල දී ලැබුණු පිළිවෙලින් රු. 387,500 ක හා රු. 142,000 ක ආදායම අතිතානුයෝගීව ගැලපීම් කිරීමෙන්

තොරව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 529,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ඇ) දළ වශයෙන් රු. 4,251,260 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 3 හි විධිවිධාන ප්‍රකාරව, එම වත්කම්වල ඵලදායී ආර්ථික ජීව කාලය යළි ඇගයීමෙන් තොරව හා ඒ අනුව ගිණුම්ගත කිරීමකින් තොරව අධිකාරිය විසින් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි. තවද මෙම කාර්යය සඳහා විධිමත් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ජංගම නොවන වත්කම්, එම වත්කම්වල සාධාරණ අගය නිරූපණය කර නොතිබුණි.

ඈ) 2006 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා හිඟ හිට තිබූ රු. 22,466,288 ක් සහ රු. 2,695,954 ක්වූ පිළිවෙලින් හිඟ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් නොගෙවීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව හා සේවක භාරකාර අරමුදල් මණ්ඩලය වෙත පැමිණිලි දෙකක් ඉදිරිපත් කර තිබුණි. ඉන් අනතුරුව අධිකාරිය විසින් රු. 2,695,954 ක හිඟ දායක මුදල් හා ඊට අදාල අධිභාරය දින 14 ක් තුල ප්‍රේෂණය කළ යුතු බවට දන්වා 2019 දෙසැම්බර් 07 වන දින සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය විසින් අවසන් සිහිකැඳවීමක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලං. රා. ගි.ප්‍ර - 08 හි අවශ්‍යතාවය ප්‍රකාරව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 25,162,242 ක මුදලක් අසම්භාව්‍ය වගකීමක් ලෙස වෙන් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඉ) 2019 වර්ෂය තුළ කල්බදු කුලී ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් කිසිදු අරමුදලක් ලැබී නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ කල්බදු කුලී ලැබීම් ලෙස රු. 5,068,537 ක මුදලක් දක්වා තිබුණි. තවද, මේ සම්බන්ධයෙන් විගණනයට හේතු දක්වන ලෙස ඉල්ලීම් කර තිබුණද, ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කර නොතිබුණි.

(ඊ) පසුගිය වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවන ලද රු. 670,643 ක් වටිනා එකතු කළ අගය මත බදු (වැට්), වැට් පාලන ගිණුමට හර කිරීම් වෙනුවට ප්‍රමාද දෝෂයකින් එය කොන්ත්‍රාත්කරුගේ අත්තිකාරම් ගිණුමට ඇතුලත් කර තිබුණි. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 1,245,629 ක කොන්ත්‍රාත්කරු අත්තිකාරම් ගිණුම රු. 670,643 ක් වැඩියෙන් දක්වා තිබූ අතර, එම දිනට වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛන අනුව, 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැට් බදු පිළිවෙලින් රු. 963,217 ක් සහ රු .629,147 ක් විය. කෙසේ වුවද සංශෝධිත ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම අනුරූපී වැට් බදු පිළිවෙලින් රු .274,282 ක ගෙවිය යුතු වැට් බදු යනුවෙන් හා රු. 145,432 ක ලැබිය යුතු වැට් බදු යනුවෙන් දක්වා තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ලැබිය යුතු සහ ගෙවිය යුතු වැට් බදු වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඌ) ඉදිකිරීම් විශිෂ්ටත්වය පිරිනැමීමේ උත්සවය පැවැත්වීම සඳහා අනුග්‍රාහකත්ව ලබා ගැනීමට බාහිර පාර්ශවයන්ට යවන ලද ඉල්ලීම් ලිපි අඩංගු අදාළ ලිපිගොනු සහ තත්‍ය වශයෙන් ලැබුණු මුදල් හා ඒ සඳහා දරන ලද වියදම් ආදී තොරතුරු නොමැතිවීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 3,214,043 ක් වූ

ඉදිකිරීම් විශිෂ්ටත්වය සඳහා අනුග්‍රාහකත්වයන්ගෙන් ලැබුණු ආදායම සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(එ) ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) ස්ථාපිත කර ඇති බන්තරමුල්ල පිහිටි ඉඩම් සම්බන්ධයෙන් අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) අතර එලඹී බදු ගිවිසුම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම, නාගරික සංවර්ධන අධිකාරියෙන් රු. 54,890,701 ක මුදල නිරවුල් කර මෙම දේපලෙහි හිමිකම ලබා ගන්නා ලෙස 2019 ජුනි 21 දිනැති ලිපියකින් දන්වා තිබුනද 2019 දෙසැම්බර් 31 දින දක්වාද මෙම ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං වි ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරනය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුළත් වේ.

- තත්වාගණනය කළ මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට අධිකාරිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
අ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 7 (1) වගන්තිය	අවම වශයෙන් මාස තුනකට වරක්වත් ජාතික උපදේශන සභා රැස්වීම් පැවැත්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී එවැනි රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. ඒ අතරතුර, ඉකුත් වර්ෂයේදී පවත්වා ඇත්තේ එක් රැස්වීමක් පමණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	

- මුදල් රෙගුලාසි 102,103,104,105 හා 110	විගණනයට ඉදිරිපත් කරන ලද තෙරතුරු වලට අනුව, 2019 වර්ෂය තුළදී අවස්ථා 10 කදී වාහන අනතුරු 07 ක් සිදුවී තිබුණු අතර වාහන 04 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු. 241,597 ක් දරා තිබුණි. වාහන 03 ක් 2020 ජූනි 30 දක්වාත් අලුත්වැඩියා කර නොතිබූ අතර, විවිධ කරුණු හේතුවෙන්, භාවිතා කර නොතිබුණි. කෙසේ වුවද, අලාභයේ ප්‍රමාණය සහ හේතු සොයා බැලීමට සහ වගකීම පැවරීමට කිසිදු විමර්ශනයක් ආරම්භ කර නොතිබුණි. තවද, මෙම වාහන අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ අවසාන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
- 2015 ජූලි 14 දිනැති හා අංක: 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371	i ගණුන් දීමේ නිලධාරියෙකුට එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමේ බලය ඇත. එසේ වුවද, එකතුව රු.1,115,000 ක් වූ තත්කාර්ය අත්තිකාරම් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව අවස්ථා 11 කදී මාණ්ඩලික නිලධාරියෙකුට ලබා දී තිබුණි. ii ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමයන්, ඒවා ලබා දුන් අරමුණු නිම වූ විගසම පිය විය යුතුය. ඇතැම් අවස්ථාවකදී,ඉහත අතුරු අග්‍රිමයන් පිය වනු ලැබුයේ දින 07 සිට දින 34 දක්වා කාල පරාසයක් ප්‍රමාද කිරීමෙන් පසුවය. ඒ අතරින් රු. 320,045 ක එනම් ආසන්න වශයෙන් සියයට 28 ක අත්තිකාරම් අදාල අරමුණු සඳහා යොදා ගැනීමකින් තොරව මුදලින් පියවා තිබුණි. එබැවින්, අත්තිකාරම් ලබා දීමට පෙර නිසි ඇගයීමක් කර නොතිබීම හේතුවෙන් අධිකාරිය විසින් සිය සේවකයින් හට මහජන මුදල් අවභාවිතා කිරීම සඳහා ඉඩ සලසා දී තිබීම විගණනයේදී නිරීක්ෂණය විය.

	iii සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී ලබා දුන් එකතුව රු.7,830,458 ක් වූ පුහුණු කිරීමේ අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දක්වාත් පියවා නොතිබුණි.
- මුදල් රෙගුලාසි 756, 757, 758 සහ 759	i 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු. 148,359,110 ක් වටිනා තොගයෙහි භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය අවසානයේදී භෞතික තොග ගණනය කිරීමකින් සිදු කර තිබීම නිරීක්ෂණය නොවිය. ii සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවශ්‍යතාවය පරිදි සිදුකර නොතිබුණි.
ඇ) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී / 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මෙම චක්‍රලේඛයේ සඳහන් පරිදි අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන රු. 151,857,303 ක (2018- රු. 150,701,803) මුදලක් ඉල්ලුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වැනි කෙටි කාලීන ආයෝජන මාර්ගවල ආයෝජනය කර තිබුණි.
ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන යහපාලනය සඳහා මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය i 1.2.5. ඡේදය	සෙමින් චලනය වන හා යල්පැනගිය තොග හඳුනා ගැනීම මගින් තොගවල වයස් විශ්ලේෂණය මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කර නොමැත.
ii 5.1.3. ඡේදය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම අවශ්‍ය පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඉ) 1990 ඔක්තෝම්බර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සියලුම වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස හයකට වරක් හෝ පරීක්ෂා කළ යුතුය. කෙසේ වුවද, මෙම පරිපාටිය අධිකාරියට අයත් වාහන 46 කින් වාහන 29 ක් සම්බන්ධයෙන් සිදුකර නොතිබුණි. එබැවින් සමාලේචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 13,620,951 ක ඉන්ධන පරිභෝජන වටිනාකම පිළිබඳ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කළ නොහැකි විය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණය හැර, අධිකාරියෙ බලතල, කර්තව්‍ය හා කාර්යයන් වලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 13 (ධ), (ක), (ච) සහ (ට) යන වගන්ති අනුව, මෙම පනත යටතේ සාදන ලද නීතිරීති අනුව තීරණය කළ හැකි පරිදි, දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීම සහ මූල්‍ය හා අලෙවිකරණ හැකියාවන් යටතේ ඒවා ශ්‍රේණිගත කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ භාවිතාවන ඉදිකිරීම් ද්‍රව්‍ය හා ඉදිකිරීම් සංරචක ආනයනකරුවන්, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම සහ ඉදිකිරීම් කර්මාන්තයේ පුහුණු කම්කරුවන්ට ශිල්ප හැඳුනුම්පත් ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම අධිකාරිය විසින් සිදුකර නොතිබුණි.

(ආ) එසේම, පනතේ 19 (1) වගන්තිය අනුව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල ස්ථාපිත කිරීමද සිදු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3.4 ලියාපදිංචි කරන ලද නිපුණ ඉදිකිරීම් ශිල්පීන් වෙත ශිල්ප හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා අධිකාරිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජ්‍යායතනය (ICTA) සමඟ 2019 ජූලි 24 වන දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබූ අතර ව්‍යාපෘති සඳහා වන ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 56.74 ක් විය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත හැකි වගකීම් සහතිකයක් ලබා ගැනීමෙන් තොරව, ඉහත මුදලින් රු. මිලියන 11.35 මුදලක් 2019 අගෝස්තු 13 වන දින

වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වෙත ගෙවා තිබුණු අතර මෙම කොන්ත්‍රාත් වැඩ එම ආයතනය (ICTA) වෙත ලබා දීම සඳහා අදාළ අනුමැතීන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, අවබෝධතා ගිවිසුමේ 1.2 වගන්තියට අනුව, මෙම ව්‍යාපෘතිය 2019 සිට 2020 අතර කාලය තුළ නිම කිරීමට එකඟ වී තිබුණි. එසේ වුවද, මෙම වාර්තාවේ දිනය දක්වාත් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබූ අතර එම ආයතනය (ICTA) වෙත ගෙවන ලද අත්තිකාරම් ඵල රහිත වී තිබුණි.

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) එකතුව රු.31,142345 ක ණයහිමියන් සඳහා කාල විශ්ලේෂණය සහ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, විගණනය විසින් කරන ලද ගණනය කිරීම් වලට අනුව, එකතුව රු. 5,251,265 ක් වූ වෙළඳ ණය හිමියන් සහ විවිධ ණය හිමියන් 2019 දෙසැම්බර් 31 දින වන විට වසර 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවති බව අනාවරණය වූ අතර මෙම ශේෂය 2020 ජුනි 30 වන විටත් නිරවුල් නොකර වෙනස් නොවී පැවතුනි.

(ආ) එකතුව රු. 19,510,624 ක් වන මුළු ණයගැති ශේෂයෙන් අහඹු ලෙස තෝරාගත් රු. 10,467,054 ක වටිනාකමකින් යුත් ණය ගැතියන් 37 දෙනෙකුගෙන් තහවුරු කිරීම් කැඳවන ලදී. කෙසේ වුවද, 2020 ජුනි 30 දක්වාත් කිසිදු ණය ගැතියෙකු විසින් ඔවුන්ගේ හිඟ ශේෂයන් තහවුරු කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයගැති ශේෂයන් අයකර ගැනීම් පිළිබඳව විගණනයේදී සැක සහිතය.

(ඇ) විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව, එකතුව 8,371,180 ක්වූ ණයගැති ශේෂයන් 2020 ජුනි 30 දින වන විටත් වසර 03 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. එයින් රු. 7,598,264 ක මුදලක් වසර පහකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඈ) අධිකාරියට අයත් නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ (CHPB) පවතින භාවිතයට නොගත් විශාල ගොඩනැගිලි ප්‍රමාණයක් පසුගිය වර්ෂ කිහිපයක සිට විවිධ පාර්ශවයන්ට බදු දී තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන රු.361,245 ක කුලී ආදායමත් 2020 ජුනි 30 දක්වාත් පාර්ශවකරුවන් දෙදෙනෙකුගෙන් අය කර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. තවද, 2020 ජුනි 30 වන විටත් පාර්ශවකරුවන් 04 දෙනෙකු සමඟ එළඹී බදු කුලී ගිවිසුම් අලුත් කර ගැනීමට අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ඉ) වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද ප්‍රකාශන සියල්ලම පාහේ වර්ෂ 09 සිට 32 දක්වා කාල පරාසය තුල සංශෝධනය කර හෝ යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය. එබැවින්, පනතේ පෙන්වා දී ඇති (අ) ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් සකස් කිරීම (ආ) ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වන ආචාරධර්ම පද්ධති, පරිචයන්, ක්‍රියා පටිපාටීන් හා වැඩපිළිවෙල සහ ලේඛන සකස් කර ක්‍රියාත්මක කිරීම සහ (ඇ) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරසාර වර්ධනය ප්‍රබෝධමත් කිරීම, ප්‍රතිසංවිධානය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ පරදු දරන්නන්ට ක්‍රමෝපාය නායකත්වය ලබා දීම යන අරමුණු ඉටු කර ගැනීම පිළිබඳව විගණනයේදී ප්‍රශ්නගත වේ.

(ඊ) "ශිල්ප සවිය" පුහුණු වැඩසටහන යටතේ පුහුණු කරනු ලබන පුහුණුකරුවන් අතර බෙදා දීම සඳහා රු.155,684,319 ක වටිනාකමකින් යුත් පොත් සහ සහරා, නිල ඇඳුම් සහ මෙවලම් කට්ටල 2016 සිට 2018 දක්වා කාලය තුල මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 16 දින පවත්වන ලද භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූයේ එම භාණ්ඩ අතරින් රු.10,924,385 ක් වටිනාකමකින් යුත් භාණ්ඩ පුහුණුකරුවන් වෙත බෙදා දී නොමැතිව අධිකාරිය සතු ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) කාමර දෙකක 2020 ජුනි 30 දක්වාත් රඳවා තබා තිබුණු බව අනාවරණය විය.

(උ) සමාලෝචිත වර්ෂය තුළ සහ ඉකුත් වර්ෂවල විවිධ අරමුණු සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් එකතුව රු.252,539,098 ක මුදල අදාළ අරමුණු සඳහා උපයෝජනය කිරීමකින් තොරව අධිකාරියේ බැංකු ජංගම ගිණුම්වල රඳවා ගෙන තිබුණි. ඊට අමතරව, රේඛීය අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් 2020 ජනවාරි 01 දින රු.14,612,249 ක ප්‍රාග්ධන අග්‍රිමයක් අධිකාරිය වෙත ලැබී තිබුණි. කෙසේ වුවද, මෙම මුදල 2020 වර්ෂය සඳහා අග්‍රිම ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇති අතර 2020 ජුනි 30 දින දක්වාත් මෙම මුදල බැංකු ගිණුමක අක්‍රියව පැවතුණි.

(ඌ) අධිකාරියේ ජංගම ගිණුම් 3 කට අදාලව බැංකු ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්ට අනුව, රු. මිලියන 361.33 ක් (2018 - රුපියල් මිලියන 329.94 ක්) ආදායම් උත්පාදනය සඳහා යොදා නොගැනීම සහ වර්ෂය තුල පෙර වර්ෂ තුළ ලැබුණු භාණ්ඩාගාර ප්‍රදානයන් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට එම ජංගම ගිණුම් වල රඳවා තිබුණි. මේ අතර, එම දිනට එම ගිණුම් තුනහි මුදල් පොතේ ශේෂය රුපියල් මිලියන 355.33 ක් විය (2018 - රුපියල් මිලියන 301.6). තවද, සමාලෝචිත වර්ෂය පුරාම සාමාන්‍යයෙන් රු. මිලියන 300 ක මුදලක් (2018 - රුපියල් මිලියන 213) කිසිදු කටයුත්තක් සඳහා යොදා ගැනීමෙන් තොරව එම බැංකු ජංගම ගිණුම්වල අක්‍රියව රඳවා තිබුණි. මේ අතරතුර, මෙම ජංගම ගිණුම් තුනේ බැංකු ශේෂ 2020 ජුනි 30 දින වන විට රු. මිලියන 394.28 දක්වා වැඩි වී තිබුණි.

(එ) 2018 වර්ෂයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ අධිකාරිය අතර එළඹී ගිවිසුමට අනුව, තෝරාගත් GCC රටවල ශ්‍රී ලංකා කම්කරුවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සහ අවදානම අවම කිරීම සඳහා රු. 10,169,300 කට නොවැඩි ප්‍රදානයක් ලබා දීමට එකඟ වී තිබුණු අතර එයින්, රු. 2,590,900 ක් සහ රු. 7,098,422 ක් පිළිවෙලින් 2018 සහ 2019 වර්ෂයන් තුළ ලැබී තිබුණි. කෙසේ වුවද, එයින් රු .3,151,369 ක මුදලක් පමණක් වියදම් ලෙස දරා තිබුණු අතර ඉතිරි මුදල රු. 6,537,953 ක් අදාළ අරමුණු සඳහා යොදවා නොගෙන අධිකාරියේ ආදායමක් ලෙස සලකා තිබුණි. තවද, මෙම වාර්තාවේ දිනය දක්වාද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) ස්වේච්ඡා විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් වෙත පාරිතෝෂික ගෙවීම සඳහා අධිකාරිය සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන සහ අරමුදලක් තිබීම සැලකිල්ලට නොගෙන එම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් නිලධාරීන්ට පාරිතෝෂික ගෙවීම් සඳහා අධිකාරියේ ඉල්ලීම් මත ඉකුත් වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් රු. 9,276,587 ක මුදලක් ලබාදී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු සියළු මුදල් ආදායමක් ලෙස සලකා අදාළ අරමුණු සඳහා යොදා ගැනීමෙන් තොරව මෙම වාර්තාවේ දිනය දක්වාත් අධිකාරිය සතු බැංකු ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ධ) වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් අවශ්‍ය අරමුදල් මූල්‍යකරණය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මූල්‍ය කල්බදු පදනම මත ලබාගත් වාහන 03 ක් සඳහා කල්බදු වාරික ලෙස සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ අරමුදලෙන් රු.8,729,172 ක (ප්‍රාග්ධන වශයෙන් රු .5,068,537 සහ පොලිය වශයෙන් 3,660,635 ක්) මුදලක් ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. එසේ වුවද, මහා භාණ්ඩාගාරය විසින් එකඟ වූ පරිදි 2020 ජුනි 30 දක්වාත් මෙම කාර්යය සඳහා කිසිදු අරමුදලක් ලබාදී නොතිබුණි. තවද, ඉහත සඳහන් නව වාහන 03 ක් ප්‍රසම්පාදනය කිරීම වෙනුවෙන් දැනට පවතින වාහන 03 ක් අපහරණය කිරීමට නිරණය කර තිබුණි. කෙසේ වුවද, එම වාහන වලින් වාහන 02 ක් පමණක් රු. 5,773,000 කට 2015 ජූලි 10 දිනැති අංක 02/15 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අපහරණය කර තිබුණු අතර අපහරණයෙන් ලද මුදල 2018 ජූලි 16 දිනැති අංක 03/2018 ජාතික අයවැය චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව අධිකාරියේ රඳවා ගෙන තිබුණි.

(ධා) විගණනය වෙත ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2003 ජූනි 02 දිනැති හා අංක PED/ 12 දරන යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සේවකයෙකු 2015 පෙබරවාරි 09 දින සිට බලපැවැත්වෙන පරිදි එවකට රේඛීය අමාත්‍යාංශයට (නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයට) මුදා හැර / අනුයුක්ත කරන ලදී. 2015 පෙබරවාරි 09 සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා මෙම නිලධාරියා වෙත වැටුප් හා අනෙකුත් දීමනා ලෙස ආසන්න වශයෙන් රු. 4,117,355 ක මුදලක් ගෙවා තිබුනද, 2020 ජූනි 30 දින දක්වාත් රේඛීය අමාත්‍යාංශයෙන් කිසිදු මුදලක් ප්‍රතිපූරණය කර නොතිබුණි.

අත්සන් කළේ - විගණකාධිපති

4.0 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තනඅ නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
01. වරින් වර නියම කළ හැකි ඉදිකිරීම් කර්මාන්තයේ සියලුම පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම	98		
02. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ, වර්යාධර්ම, ලියකියවිලි සහ යහපත් පරිචයන් ස්ථාපිත කිරීම	99		
03. නවෝත්පාදන පර්යේෂණ හා සංවර්ධන (R & D) /තාක්ෂණය / තොරතුරු බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීම		84	
04. සහයක / මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරන ආරවුල් විසඳීමේ සේවා සැපයීම සහ ඉදිකිරීම් කර්මාන්තයට විනිශ්චය සේවා සඳහා සහය වීම	100		
05. සම්මත ලංසු ලේඛන ප්‍රකාශයට පත් කිරීම. , නව ප්‍රමිතීන් / පිරිවිතරයන් කොටුම්පත් කිරීම සහ පවත්නා ප්‍රමිතීන් / පිරිවිතරයන් සමාලෝචනය කිරීම,ඉදිකිරීම් සංඛ්‍යාලේඛන මාසික ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම		89	
06. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ සම්මන්ත්‍රණ / වැඩමුළු පැවැත්වීම	> 100		
07. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ සම්මන්ත්‍රණ / වැඩමුළු පැවැත්වීම දිස්ත්‍රික් මට්ටමේ පුහුණු දින 1	> 100		
08. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ සම්මන්ත්‍රණ / වැඩමුළු පැවැත්වීම දිස්ත්‍රික් මට්ටමේ පුහුණු දින 2			70
09. දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන්ගේ සේවය			<50

i.) දිස්ත්‍රික් මට්ටමින් උපදේශන සේවා/ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ සහය / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම ආදිය			
10. දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන්ගේ සේවය ii.) ලියාපදිංචි කිරීමේ ලියකියවිලි / වෙනත් ලියකියවිලි විකිණීම iii.) දිස්ත්‍රික් මට්ටමේ ඉදිකිරීම් සම්බන්ධයෙන් පුවත්පත් ලිපි පළ කිරීම			<50
11. තාක්ෂණ නොවන ආයතනවල කුඩා පරිමාණයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම සහ උපදේශන සේවා සැපයීම.			<50
12. තාක්ෂණ විගණන සේවා සැපයීම තාක්ෂණ විගණන සිදු කිරීම සහ තාක්ෂණ විගණන ඉල්ලුම් කිරීම			<50
13. තත්ත්ව කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම(විශිෂ්ටතා සම්මානය සහිතව)			<50
14. විනිශ්චයකරුවන් ලියාපදිංචි කිරීම			<50
15. ඉදිකිරීම් විනිශ්චය ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම - 1 වන කණ්ඩායම ආරම්භ කිරීම			<50
16. ආපදා ප්‍රතිරෝධී, බලශක්ති කාර්යක්ෂම හා පාරිසරික වශයෙන් සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර ආර්ථික වර්ධනයන් ප්‍රවර්ධනය කිරීම			<50
17. ඉදිකිරීම් කර්මාන්තයේ ඍත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිතීන් සහ භාවිතයන් වැඩි දියුණු කිරීම			62
18. ප්‍රකාශන විකිණීම (විකුණන ලද ප්‍රකාශන සංඛ්‍යාව ලෙස ඉලක්ක නියම කර ඇත)			58
19. පුහුණු වැඩසටහන් (CHPB)	> 100		

20. සම්මන්ත්‍රණ / වැඩමුළු (CHPB)	> 100		
21. සම්පූර්ණ අහිමත සැලසුම් පුහුණු ක්‍රියාකාරකම් සහ කෙටිකාලීන වැඩසටහන්(CHPB)	> 100		

5.0 මානව සම්පත් පැතිකඩ

5.1 සේවක කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවත්නා සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	36	30	6
තෘතියික	71	48	23
ද්විතියික	123	92	31
කණිෂ්ඨ	160	112	48
එකතුව	390	282	108

5.2 ආයතනයේ ක්‍රියාකාරිත්වයට මානව සම්පත්වල හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කිරීම.

ආයතනයේ සියලුම මට්ටම්වල අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණයෙන් බඳවාගෙන නොමැත. කාර්යයන් නිම කිරීම සහ ව්‍යාපෘති සාක්ෂාත් කර ගැනීම සඳහා ගතවන අතිරික්ත කාලය සඳහා සිඩා පනතේ රීති අනුව දායක වී ඇත. කෙසේ වුවද වැඩ ප්‍රමාද වීම සැලකිය යුතු මට්ටමක නොවේ.

5.3 සේවකයන්ගේ ධාරිතා සංවර්ධනය

අනු අංකය	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලය	මූල ආයෝජනය රු.		වැඩසටහනේ ස්වාභාවය දේශීය / විදේශීය	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	අභ්‍යන්තර විගණන සැලසුම් කිරීම	2	දින 2	14,000		දේශීය	කුසලතා සංවර්ධනය
02	ඉදිකිරීම් නිෂ්පාදනය	2	දින 2	නොමිලේ		දේශීය	තාක්ෂණික දැනුම
03	ඩිප්ලෝමා - මෘදුකාංග ඉංජිනේරු	1	වර්ෂ 1	75,000		දේශීය	කුසලතා සංවර්ධනය
04	ධනාත්මක ආකල්ප අභිප්‍රේරණ නායකත්වය	85	දින 2	240,000		දේශීය	කුසලතා සංවර්ධනය
05	ජාලය සහිත පරිගණක දෘඩාංග	1	මාස 5	34,000		දේශීය	තාක්ෂණික දැනුම සංවර්ධනය
06	පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	1	මාස 6	36,000		දේශීය	කුසලතා සංවර්ධනය
07	Refresher පාඨමාලාව	1	දින 4			විදේශීය	කුසලතා සංවර්ධනය
08	පුහුණුකරු පුහුණු කිරීමේ වැඩසටහන	20	දින 4		293,240	විදේශීය	කුසලතා සංවර්ධනය
09	ධාරිතා ගොඩනැගීම	1	දින 15			විදේශීය	තාක්ෂණික දැනුම සංවර්ධනය
10	BRCA වැඩමුළුව	2	දින 2			විදේශීය	කුසලතා සංවර්ධනය
11	මෙහෙයුම්කරු	4	දින 6			විදේශීය	කුසලතා

	පුහුණුව						සංවර්ධනය
12	Asia Construct	1	දින 3			විදේශීය	තාක්ෂණික දැනුම සංවර්ධනය
	එකතුව	121		399,000	293,240		

6.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල විය /අනුකූල නොවීය)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීම	ඉදිරියේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1.	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල විය		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	අනුකූල විය		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවීය	අධිකාරිය නිෂ්පාදන කාර්යයන් සිදු කරයි.	
1.4	ගබඩා අත්තිකාරම්	අනුකූල නොවීය	ගබඩා තැබීම අපගේ අධිකාරියේ කාර්යයන් ලෙස නොසැලකේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල විය		
1.6	වෙනත්			
2.	පොත් හා ලේඛන පවත්වා ගැනීම (FR445)			
2.1	ස්ථාවර වත්කම් ලේඛන අංක 267/2018 දරන රාජ්‍ය	අනුකූල විය		

	පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.			
2.2	පුද්ගලික පඩිනඩි ලේඛනය / අනුකූල වීම පුද්ගලික පඩිනඩි කාඩ්පත් පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.3	විගණන විමසුම් ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත.	අනුකූල නොවිය	(CIGAS)වැඩසටහන යටතේ කටයුතු කිරීමට රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවලට උපදෙස් ලැබී නැත.	පිරිඩි 19 ප්‍රකාරව මාසික ගිණුම් කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත	අනුකූල විය		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.8	තොග ලේඛන පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.9	පාඩු ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		

2.10	බැඳීම් ලේඛනය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
2.11	අනුපිටපත් පොත් ලේඛනය (GA – N20)පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇත.	අනුකූල විය		
3.	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් පැවරීම (FR 135)			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා ඇත	අනුකූල විය		
3.2	ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම සන්නිවේදනය කර ඇත	අනුකූල විය		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් මඟින් සම්මත කර ගැනීම සඳහා අධිකාරිය විසින් පවරා ඇත.	අනුකූල විය		
3.4	රජයේ වැටුප් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව පාලනයන් පිළිපැද ඇත.	අනුකූල විය		
4.	වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත	අනුකූල විය		

	දිනට ඉදිරිපත් කර ඇත.			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
5.	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් දක්වා ඇති නියමිත දිනට සියලු විගණන විමසුම් වලට පිළිතුරු ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
6.	අභ්‍යන්තර විගණනය			
6.1	මූල්‍ය රෙගුලාසි 34 හා DMA I209 ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කර ඇත.	අනුකූල විය		
6.2	සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මාසයක් ඇතුළත පිළිතුරු ලබාදී ඇත.	අනුකූල නොවිය	අදාළ තොරතුරු එකතු කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන්	පිළිතුරක් සඳහා තොරතුරු රැස්කිරීමට කාලය ගත වුවහොත් අතුරු පිළිතුරක් යවනු ලැබේ.
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) වන උප වගන්තිය ප්‍රකාරව සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව, සියලු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
7.	විගණන හා කළමනාකරණය කමිටු			

7.1	ඩිඑම්ඒ චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වර්ෂය තුළ අවම වශයෙන් කළමනාකරණ කමිටු 4 ක් පවත්වා ඇත.	අනුකූල විය		
8.	වත්කම් කළමනාකරණය			
8.1	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 ඡේදය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු පාලන ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
8.2	විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර ඇත. ඉහත චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛය සහ පත් කරන නිලධාරියාගේ තොරතුරු පාලක ජනරාල් කාර්යාලයට යවා ඇත.	අනුකූල විය		
8.3	අංක 05/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
8.4	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත සහ ඌනතා සහ වෙනත් අදාළ නිර්දේශ,පිළිබඳව චක්‍රලේඛයේ දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ ක්‍රියාමාර්ග ගෙන ඇත.	අනුකූල විය		
8.5	ගර්හිත භාණ්ඩ පිළිබඳ අපහරණයන් මු.රෙ. 772 ප්‍රකාරව සිදු කර ඇත.	අනුකූල විය		
9.	වාහන කළමනාකරණය			

9.1	සංචිත වාහනවල දෛනික ධාවන වාර්තා සහ මාසික සාරාංශ පිළියෙල කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
9.2	ගර්හිත කිරීමෙන් පසු මාස 06 ක කාල පරිච්ඡේදයක් ඇළත ගර්හිත වාහන අපහරණය කර ඇත.	අනුකූල නොවිය	කාලය ප්‍රමාණවත් නොවීම	එසේ කිරීම සඳහා යථා කාලයේදී පියවර ගනු ලැබේ.
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ඇත.	අනුකූල විය		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 සහ 110 ප්‍රකාරව පියවර ගෙන ඇත.	අනුකූල විය		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත.	අනුකූල විය		
9.6	කල්බදු වාහන වල පරම භිමිකාරිත්වය කල්බදු කාලයෙන් පසු මාරු කර ඇත.	අනුකූල විය		
10.	බැංකු ගිණුම් කළමනාකරණය කිරීම			
10.1	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර නියමිත දිනට විගණනය සඳහා සුදානම් කර ඇත.	අනුකූල විය		
10.2	සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල සිට පවතින අක්‍රිය ගිණුම් නිරවුල් කර ඇත.	අනුකූල විය		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය කර ඇති ශේෂයන් සහ ඒ සඳහා සිදු කළ යුතු ගැලපීම් හා මාසයකු ඇතුළත එම ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇත.	අනුකූල විය		
11.	ප්‍රතිපාදන උපයෝජනය කිරීම			
11.1	වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාවන් ඉක්මවීමෙන් තොරව වැය කර ඇත.	අනුකූල විය		
11.2	මූදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා නොයන වර්ෂය අවසානයේ පවතින වගකීම්	අනුකූල විය		
12.	රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම			
12.1	සීමාවන්ට අනුකූල වී ඇත.	අනුකූල විය		
12.2	හිඟව පවතින ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර ඇත.	අනුකූල විය		
12.3	වර්ෂයකට අධික හිඟ ණය ශේෂ නිරවුල් කර ඇත.	අනුකූල විය		
13.	පොදු තැන්පතු ගිණුම			
13.1	ඉකුත් තැන්පතු අපහරණය කිරීම සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඇත.	අනුකූල විය		
13.2	පොදු තැන්පතු පාලන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ඇත.	අනුකූල විය		
14.	අග්‍රිම ගිණුම			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත.	අනුකූල විය		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කරන තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර ඇත.	අනුකූල නොවිය	මසකට වැඩි කාලයක් මෙම අත්තිකාරම් පැවතුණි.	අධිකාරියේ වක්‍රලේඛනවලට අනුව අත්තිකාරම් නිරවුල් කරන තෙක් වැටුප් අත්හිටුවා ඇත.
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්ම වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර ඇත.	අනුකූල විය		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ඇත.	අනුකූල නොවිය	රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් භාණ්ඩාගාර පොත් පවත්වනු නොලැබේ.	පිරිවි 19 ප්‍රකාරව මාසික ගිණුම් වාර්තා අධිකාරියේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
15.	ආදායම් ගිණුම			
15.1	ආදායමෙන් ආපසු ගෙවීම් රෙගුලාසි ප්‍රකාරව සිදු කරනු ලැබේ.	අනුකූල විය		
15.2	ආදායම් එකතු කිරීම් තැන්පතු ගිණුමට බැර කිරීමෙන් තොරව සෘජුවම ආදායමට බැර කර ඇත.	අනුකූල විය		
15.3	හිඟ ආදායම් වාර්තා මු.රෙ. 176 ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල්ව ඉදිරිපත් කර ඇත.	අනුකූල නොවිය	රාජය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලට එසේ කිරීමට උපදෙස් දී නොමැත.	හිඟ ආදායම් වාර්තා විගණන හා කළමනාකරණ කමිටුවට සහ අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරයි.

16.	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සේවක සංඛ්‍යාව තුල කාර්ය මණ්ඩලයට ගෙවා ඇත.	අනුකූල විය		
16.2	සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ලිඛිතව රාජකාරි ලැයිස්තු ලබාදී ඇත.	අනුකූල විය		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛය ප්‍රකාරව සියලුම වාර්තා එම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		
17.	මහජනතාව සඳහා තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත හා රෙගුලාසි ප්‍රකාරව, තොරතුරු සැපයීමේ නිලධාරියෙකු පත්කර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ඇත.	අනුකූල විය		
17.2	වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් ආයතනය පිළිබඳ තොරතුරු මහජනතාවට ලබාදී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මඟින් අධිකාරිය ඇගයීම/ අධිකාරියට එරෙහිව චෝදනා කිරීම සඳහා පහසු කර තිබේ.	අනුකූල විය		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 සහ 10 වගන්ති ප්‍රකාරව ද්වි-වාර්ෂික සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.	අනුකූල විය		

18.	පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ 05/2018 (1)දරන චක්‍රලේඛ ප්‍රකාරව ආයතනය විසින් පුරවැසි ප්‍රඥාප්තියක් / පුරවැසි සේවාදායක ප්‍රඥාප්තියක් සකස් කර ක්‍රියාත්මක කර ඇත.	අනුකූල විය		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥාප්තිය / පුරවැසි සේවාදායක ප්‍රඥාප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමනය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සැලසුම් කර ඇත.	අනුකූල විය		
19.	මානව සම්පත් සැලැස්ම සකස් කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඇමුණුමෙහි ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇත.	අනුකූල විය		
19.2	ඉහත මානව සම්පත් සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථාවක් සහතික කර ඇත.	අනුකූල විය		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර ඇත.	අනුකූල විය		

19.4	ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදය අනුව, ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර, මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ඇත.	අනුකූල විය		
20.	විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම			
20.1	පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන ඡේදවල පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඇත.	අනුකූල විය		